# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

# දහහත්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය

---

**[සහතිකය සටහන් කළේ 2001 ඔක්තෝබර් මස 03 වන දින]**

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

2001 ඔක්තෝබර් මස 05 වන දින **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ** II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 1, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකිය.

**මිල : රු. 39.50 යි.** තැපැල් ගාස්තුව : රු. **8.75** යි.

# නිවැරදි කිරීමයි

පිටු අංක 53 හි 27 වන වගන්තියේ (2) වන ඡේදයෙහි ආරම්භයේ සඳහන් 104 වන ව්‍යවස්ථාවට අනුකූලව යන්න 103 වන ව්‍යවස්ථාවට අනුකූලව යනුවෙන් නිවැරදි විය යුතු ය.

[සහතිකය සටහන් කළේ 2001 ඔක්තෝබර් මස 03 වන දින.]

එල්.ඩී.-ඕ. 47/2001.

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :-

1. මේ පනත දහහත්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය.

2. (මෙහි මින් මතු "ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව" යනුවෙන් සඳහන් කරනු ලබන) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ VIIඅ පරිච්ඡේදය ලෙස බලපැවැත්විය යුතු පහත දැක්වෙන අලුත් පරිච්ඡේදය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 41 වන ව්‍යවස්ථාවට ඉක්බිතිව ම ඇතුළත් කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ :— ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට VIIඅ පරිච්ඡේදය ඇතුළත් කිරීම.

"VIIඅ පරිච්ඡේදය

**ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව**

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ සංයුතිය. 41අ. (1) පහත දැක්වෙන සාමාජිකයන්ගෙන් සමන්විත වන, (මේ පරිච්ඡේදයේ "සභාව" යනුවෙන් සඳහන් කරනු ලබන) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවක් තිබිය යුත්තේ ය :—

(අ) අග්‍රාමාත්‍යවරයා ;

(ආ) කථානායකවරයා ;

(ඇ) පාර්ලිමේන්තුවේ විරුද්ධ පක්ෂයේ නායකවරයා ;

(ඈ) ජනාධිපතිවරයා විසින් පත් කරනු ලැබිය යුතු එක් තැනැත්තෙක් ;

(ඉ) අග්‍රාමාත්‍යවරයා සහ විරුද්ධ පක්ෂයේ නායකවරයා යන දෙදෙනාගේ ම නාම යෝජනා කිරීම මත ජනාධිපතිවරයා විසින් පත් කරනු ලබන තැනැත්තන් පස් දෙනෙක් ;

2-H 012587 -6,000 (2001/09)

(ඊ) අග්‍රාමාත්‍යවරයා සහ විරුද්ධ පක්ෂයේ නායකවරයා අයත් දේශපාලන පක්ෂ හෝ ස්වාධීන කණ්ඩායම් හෝ නොවන පාර්ලිමේන්තුවේ නියෝජනයව ඇති අනෙකුත් දේශපාලන පක්ෂවල සහ ස්වාධීන කණ්ඩායම්වල පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන්ගේ බහුතරයේ එකඟත්වය මත නාමයෝජනා කර ජනාධිපතිවරයා විසින් පත් කරනු ලබන එක් තැනැත්තෙක්.

(2) කථානායකවරයා සභාවේ සභාපතිවරයා විය යුත්තේ ය.

(3) මේ ව්‍යවස්ථාවේ (1) වන ඡේදයේ (ඉ) අනුඡේදයේ සඳහන් තැනැත්තන් පස් දෙනා නම් කිරීමේ දී, අග්‍රාමාත්‍යවරයා සහ විරුද්ධ පක්ෂයේ නායකවරයා විසින් පාර්ලිමේන්තුවේ නියෝජනය වන දේශපාලන පක්ෂ සහ ස්වාධීන කණ්ඩායම්වල නායකයන් විමසිය යුත්තේ ය. ඉහත සඳහන් තැනැත්තන් පස් දෙනාගෙන් තිදෙනකු ඒ ඒ සුළු ජාතික ජන කොට්ඨාසවලට අයත් පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන් විමසා සුළු ජාතික ජන කොට්ඨාස නියෝජනය කිරීම සඳහා නාම යෝජනා කරනු ලැබිය යුත්තේ ය.

(4) මේ ව්‍යවස්ථාවේ (1) වන ඡේදයේ අවස්ථාවෝචිත පරිදි (ඇ), (ඉ) සහ (ඊ) අනුඡේද යටතේ පත් කරනු ලබන හෝ නම් කරනු ලබන තැනැත්තන්, විශිෂ්ටත්වයෙන් හා අවංක භාවයෙන් යුත්, පොදු ජන ජීවිතයේ දී කීර්තිය ලත්, කිසිදු දේශපාලන පක්ෂයක සාමාජිකයන් නොවන තැනැත්තන් විය යුත්තේ ය.

(5) මේ ව්‍යවස්ථාවේ (1) වන ඡේදයේ (ඉ) අනුඡේදය සහ (ඊ) අනුඡේදය යටතේ නාම යෝජනා පිළිබඳ ලිඛිත දැනුම්දීමක් ජනාධිපතිවරයා වෙත ලැබුණු විට ජනාධිපතිවරයා විසින් ඒ ඒ පත්කිරීම් අප්‍රමාදව කරනු ලැබිය යුත්තේ ය.

(6) (අ) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 64 වන ව්‍යවස්ථාවේ (2) වන ඡේදයේ කවර විධිවිධානයක් තිබුණ ද, පාර්ලිමේන්තුව විසුරුවා හරිනු ලැබූ විටක, ඉහත කී ව්‍යවස්ථාවේ (1) වන ඡේදය යටතේ පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරයකු කථානායකවරයා වශයෙන් තෝරා පත් කර ගන්නා තෙක්, ඒ දක්වා සිටි කථානායකවරයා සභාවේ සාමාජිකයකු ලෙස තවදුරටත් ධුරය දැරිය යුත්තේ ය.

(ආ) පාර්ලිමේන්තුව විසුරුවා හරිනු ලැබුව ද, ඉන් ඉක්බිතිව ම පවත්වන ලද මහ මැතිවරණයෙන් පසුව පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරයකු පාර්ලිමේන්තුවේ විරුද්ධ පක්ෂයේ නායකයා ලෙස පිළිගනු ලබන තෙක්, ඒ දක්වා සිටි විරුද්ධ පක්ෂයේ නායකවරයා සභාවේ සාමාජිකයකු ලෙස තවදුරටත් ධුරය දැරිය යුත්තේ ය.

(7) මේ ව්‍යවස්ථාවේ (1) වන ඡේදයේ (ඉ) අනුඡේදය සහ (ඊ) අනුඡේදය යටතේ පත් කරන ලද සභාවේ සෑම සාමාජිකයකු ම විසින්, ජනාධිපතිවරයා අමතා යවන ලිපියක් මගින් තම ධුරයෙන් කලින් ඉල්ලා අස්වුවහොත් හෝ තම ධුරයේ කටයුතු තවදුරටත් කරගෙන යාමට නොහැකි ශාරීරික හෝ මානසික අශක්නුතාවකට පත්ව ඇති බවට අග්‍රාමාත්‍යවරයා සහ විරුද්ධ පක්ෂයේ නායකවරයා යන දෙදෙනාම මතයක් ඇති කර ගන්නා අවස්ථාවක ඒ මත ජනාධිපතිවරයා විසින් ධුරයෙන් ඉවත් කරනු ලැබුවහොත් හෝ චරිත දූෂණ වරදක් සම්බන්ධයෙන් යම් අධිකරණයක් විසින් ඔහු වරදකරු කරනු ලැබුවහොත් හෝ ඔහු විෂයයෙහි පූජා අශක්නුතා නියම කිරීමේ යෝජනා සම්මතයක් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 81 වන ව්‍යවස්ථාවට අනුකූලව සම්මත කරනු ලැබ ඇත්නම් හෝ 41ඉ ව්‍යවස්ථාවේ (7) වන ඡේදය යටතේ ඔහු සිය ධුරය හැර ගියාක් සේ සලකනු ලබන්නේ නම් හෝ මිය, එවැනි සාමාජිකයකු වශයෙන් ඔහු පත් කරනු ලැබූ දින සිට අවුරුදු තුනක කාලයක් ධුරය දැරිය යුත්තේ ය.

(8) මේ ව්‍යවස්ථාවේ (1) වන ඡේදයේ (ඉ) අනුඡේදය හෝ (ඊ) අනුඡේදය යටතේ පත් කරන ලද සාමාජිකයන් අතර පුරප්පාඩුවක් ඇති වූ විටක, එම පුරප්පාඩුව ඇතිවීමේ දින සිට සති දෙකක් ඇතුළත, ඉහත සඳහන් අනුඡේදයන්හි විධිවිධාන සැලකිල්ලට ගනිමින්, ජනාධිපතිවරයා විසින් ඒ සාමාජිකයා වෙනුවට අනුප්‍රාප්තවීම පිණිස වෙනත් තැනැත්තකු පත් කරනු ලැබිය යුත්තේ ය. එසේ පත් කරනු ලැබූ යම් තැනැත්තෙක්, ඔහු අනුප්‍රාප්ත වන්නේ යම් සාමාජිකයකු වෙනුවට ද ඒ සාමාජිකයාගේ ධූර කාලයෙන් නොගෙවී ඉතිරිව තිබෙන කොටස සඳහා ධූරය දරන්නේ ය.

(9) මේ ව්‍යවස්ථාවේ (1) වන ඡේදයේ (ඇ) අනුඡේදය යටතේ පත් කරනු ලැබූ සාමාජිකයකු, ජනාධිපතිවරයා විසින් නියමිත කාලයට කලින් ධූරයෙන් ඉවත් කරනු ලැබුවහොත් මිස, අවුරුදු තුනක කාලයක් ධූරය දැරිය යුත්තේ ය.

(10) මේ ව්‍යවස්ථාවේ (1) වන ඡේදයේ (ඉ) අනුඡේදය හෝ (ඊ) අනුඡේදය යටතේ පත් කරන ලද සාමාජිකයකු, එම අනුඡේදය යටතේ නැවත පත් කරනු ලැබීමට සුදුස්සෙක් නොවන්නේ ය.

(11) මේ ව්‍යවස්ථාවේ (ඇ) අනුඡේදය, (ඉ) අනුඡේදය සහ (ඊ) අනුඡේදය යටතේ හෝ ජනාධිපතිවරයා විසින් කරන ලද පත්වීම්, කථානායකවරයාට දැනුම් දිය යුත්තේ ය.

සභාව විසින් පත්කිරීම් නිර්දේශ කළ යුතු බව.

41ආ. (1) මේ ව්‍යවස්ථාවේ උපලේඛනයේ නිශ්චිතව සඳහන් යම් කොමිෂන් සභාවක සභාපතිවරයා ලෙස හෝ සාමාජිකයකු ලෙස හෝ ජනාධිපතිවරයා විසින් තැනැත්තකු පත් කිරීම සභාවේ නිර්දේශය මත හැර, කරනු නොලැබිය යුත්තේ ය.

(2) මේ ව්‍යවස්ථාවේ (1) වන ඡේදයේ විධිවිධාන ඒ ඡේදය යටතේ පත් කරන ලද තැනැත්තකු වෙනුවෙන් වැඩ බැලීම සඳහා පත් කරනු ලැබූ යම් තැනැත්තකු සම්බන්ධයෙන් ද අදාළ විය යුත්තේ ය.

(3) මේ ව්‍යවස්ථාවේ උපලේඛනයේ නිශ්චිතව සඳහන් කොමිෂන් සභාවල සභාපතිවරුන් ලෙස හෝ සාමාජිකයන් ලෙස පත් කිරීම සඳහා අවස්ථාව එළඹෙන කවර හෝ විටක එසේ පත් කරනු ලැබිය යුතු තැනැත්තන් ජනාධිපතිවරයා වෙත නිර්දේශ කිරීම සභාවේ කාර්යයක් වන අතර ඒ නිර්දේශවලින් විවිධ ජනවාර්ගික කණ්ඩායම් පිළිබිඹු විය යුත්තේ ය.

(4) මේ ව්‍යවස්ථාවේ (1) වන ඡේදය යටතේ පත් කරනු ලබන කිසිම තැනැත්තකු, හෝ කොමිෂන් සභාවක සභාපතිවරයාගේ හෝ සාමාජිකයකුගේ වැඩ බැලීම සඳහා පත් කරන ලද තැනැත්තකු, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ හෝ යම් නීතියක හෝ විධිවිධාන සලසා තිබෙන පරිදි හැර ඉවත් කරනු නොලැබිය යුත්තේ ය. එවැනි විධිවිධාන සලසා නොමැති අවස්ථාවක දී ඒ තැනැත්තා සභාවේ පූර්ව අනුමතය ඇතිව පමණක් ජනාධිපතිවරයා විසින් ඉවත් කරනු ලැබිය යුත්තේ ය.

**උපලේඛනය**

(අ) මැතිවරණ කොමිෂන් සභාව.

(ආ) රාජ්‍ය සේවා කොමිෂන් සභාව.

(ඇ) ජාතික පොලිස් කොමිෂන් සභාව.

(ඈ) ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

(ඉ) අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශනය කිරීමේ නිත්‍ය කොමිෂන් සභාව.

(ඊ) මුදල් කොමිෂන් සභාව.

(උ) සීමා නිර්ණය කොමිෂන් සභාව.

පත්කිරීම් සභාව විසින් අනුමත කළ යුතු බව.

41ඇ. (1) ජනාධිපතිවරයා විසින් සභාවට කරන ලද නිර්දේශයක් මත, සභාව විසින් අනුමත කර ඇත්නම් මිස, මේ ව්‍යවස්ථාවේ උපලේඛනයේ සඳහන් කිසිම ධුරයකට ජනාධිපතිවරයා විසින් කිසිදු තැනැත්තකු පත් කරනු නොලැබිය යුත්තේ ය.

(2) මේ ව්‍යවස්ථාවේ (1) වන ඡේදයේ විධිවිධාන, මේ ව්‍යවස්ථාවේ උපලේඛනයේ නිශ්චිතව සඳහන් යම් ධූරයක දින දහහතරකට වැඩි කාලයක් වැඩ බැලීම සඳහා පත් කරනු ලබන යම් තැනැත්තකු සම්බන්ධයෙන් ද අදාළ විය යුත්තේ ය.

(3) මේ ව්‍යවස්ථාවේ උපලේඛනයේ නිශ්චිතව සඳහන් කවර හෝ ධූරයකට පත් කරනු ලැබූ කිසිදු තැනැත්තකු හෝ ඒ ධූරයකට පත් කරන ලද තැනැත්තකු වෙනුවෙන් වැඩ බැලීම සඳහා පත් කරනු ලැබූ කිසිදු තැනැත්තකු, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ හෝ යම් නීතියකින් හෝ විධිවිධාන සලස්වා ඇති පරිදි හැර, එකී ධූරයෙන් ඉවත් කරනු නොලැබිය යුත්තේ ය.

(4) ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිශ්චයකාරවරයන් සහ අභියාචනාධිකරණයේ සභාපතිවරයා සහ අභියාචනාධිකරණයේ විනිශ්චයකාරවරයන් පත් කිරීම හා සම්බන්ධ කර්තව්‍ය ඉටු කිරීමේ දී, සභාව විසින් අග්‍ර විනිශ්චයකාරවරයාගේ සහ නීතිපතිවරයාගේ අදහස් ලබාගත හැක්කේ ය.

## උපලේඛනය

### I වන කොටස

(අ) අග්‍ර විනිශ්චයකාරවරයා සහ ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිශ්චයකාරවරයන්.

(ආ) අභියාචනාධිකරණයේ සභාපතිවරයා සහ අභියාචනාධිකරණයේ විනිශ්චයකාරවරයන්.

(ඇ) අධිකරණ සේවා කොමිෂන් සභාවේ සභාපතිවරයා හැර අනෙකුත් සාමාජිකයන්.

### II වන කොටස

(අ) නීතිපතිවරයා.

(ආ) විගණකාධිපතිවරයා.

(ඇ) පොලිස්පතිවරයා.

(ඈ) පරිපාලන කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු කොමසාරිස් (ඔම්බුඩ්ස්මන්) වරයා.

(ඉ) පාර්ලිමේන්තුවේ මහ ලේකම්වරයා.

සභාවේ ලේකම්වරයා සහ නිලධරයන්.

41ඈ. (1) සභාවට ලේකම්වරයකු සිටිය යුත්තේ ය. ලේකම්වරයා සභාව විසින් පත් කරනු ලැබිය යුත්තේ ය.

(2) එහි කාර්ය ඉටු කිරීම සඳහා අවශ්‍ය යයි සභාව විසින් සලකනු ලබන යම් නිලධරයන්, සභාව විසින් නිශ්චය කරනු ලැබිය යුතු නියමයන් සහ කොන්දේසි මත සභාව විසින් පත් කරනු ලැබිය හැක්කේ ය.

සභාවේ රැස්වීම්.

41ඉ. (1) සභාව වෙත මේ පරිච්ඡේදයේ විධිවිධාන මගින් හෝ වෙනත් යම් නීතියක් මගින් හෝ පවරා ඇති කාර්ය ඉටු කිරීම සඳහා අවශ්‍ය විය හැකි තාක් වාර ගණනක් සභාව රැස්විය යුතු අතර, සභාවේ සභාපතිවරයාගේ විධානය මත සභාවේ ලේකම්වරයා විසින් ඒ රැස්වීම් කැඳවනු ලැබිය යුත්තේ ය.

(2) සභාපතිවරයා, සභාවේ සියලු රැස්වීම්වල මූලාසනය දැරිය යුත්තේ ය. සභාවේ යම් රැස්වීමකට සභාපතිවරයා පැමිණ නොමැති අවස්ථාවක දී අග්‍රාමාත්‍යවරයා විසින් ද අග්‍රාමාත්‍යවරයා පැමිණ නොමැති අවස්ථාවක දී විරුද්ධ පක්ෂයේ නායකවරයා විසින් ද සභාවේ රැස්වීම්වල මූලාසනය දැරිය යුත්තේ ය. සභාපතිවරයා, අග්‍රාමාත්‍යවරයා සහ විරුද්ධ පක්ෂයේ නායකවරයා යන සියලු දෙනාම යම් රැස්වීමකට පැමිණ නොමැති අවස්ථාවක පැමිණ සිටින සාමාජිකයන් විසින් ඔවුන් අතුරෙන් එක් සාමාජිකයකු ඒ රැස්වීමේ මූලාසනය දැරීම සඳහා තෝරාගනු ලැබිය යුත්තේ ය.

(3) සභාවේ යම් රැස්වීමක් සඳහා ගණපූරණය සාමාජිකයන් හය දෙනකු විය යුත්තේ ය.

(4) සභාව විසින් කරනු ලැබිය යුතු සෑම නිර්දේශයක් හෝ අනුමත කිරීමක් ද ගනු ලැබිය යුතු සෑම තීරණයක් ද ඒකමතික තීරණයක් මගින් කිරීමට සභාව විසින් උත්සාහ දරනු ලැබිය යුත්තේ ය. ඒකමතික තීරණයක් නොමැති අවස්ථාවක දී සභාවේ රැස්වීමට පැමිණ සිටින සාමාජිකයන් පස් දෙනකුට නොඅඩු සංඛ්‍යාවක් විසින් ඡන්දයෙන් සහාය කළහොත් මිස, කිසි නිර්දේශයක් හෝ අනුමත කිරීමක් හෝ තීරණයක් හෝ බලසහිත නොවිය යුත්තේ ය.

(5) සභාපතිවරයාට මුල් ඡන්දයක් නොමැති නමුත් සභාවේ යම් රැස්වීමක දී තීරණය කරනු ලැබිය යුතු යම් ප්‍රශ්නයක් සඳහා සම සමව ඡන්දය ලැබුණු අවස්ථාවක දී සභාපතිවරයාට හෝ රැස්වීමේ මූලාසනය දරන වෙනත් සාමාජිකයකුට තීරණ ඡන්දයක් තිබිය යුත්තේ ය.

(6) 41ආ සහ 41ඇ ව්‍යවස්ථා යටතේ යම් පත්කිරීමක් සඳහා යෝග්‍ය තැනැත්තන් නිර්දේශ කිරීමේ දී හෝ අනුමත කිරීමේ දී අනුගමනය කළයුතු කාර්ය පටිපාටිය ද ඇතුළුව සභාවේ රැස්වීම් සහ රැස්වීම්වල දී කටයුතු කරන ආකාරය සම්බන්ධයෙන් අනුගමනය කළ යුතු කාර්ය පටිපාටිය සභාව විසින් තීරණය කරනු ලැබිය යුත්තේ ය.

(7) 41අ ව්‍යවස්ථාවේ (1) වන ජේදයේ (ඉ) අනුජේදය යටතේ පත් කරනු ලැබූ සභාවේ යම් සාමාජිකයකු සභාවේ පූර්ව අවසරය ලබා නොගෙන සභාවේ අනුක්‍රමික රැස්වීම් දෙකකට නොපැමිණ සිටි අවස්ථාවක දී ඒ සාමාජිකයා ඒ දෙවන රැස්වීමේ දින සිට බලාත්මක වන පරිදි ධුරය අත්හරිනු ලැබුවාක් සේ සැලකිය යුත්තේ ය.

සභාව විසින් වෙනත් කාර්ය ඉටු කළ යුතු බව.

41ඊ. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් හෝ වෙනත් යම් නීතියකින් නියම කර ඇති හෝ පවරා ඇති වෙනත් කාර්ය සහ කර්තව්‍ය සභාව විසින් ඉටු කරනු ලැබිය යුත්තේ ය.

වියදම් ඒකාබද්ධ අරමුදලට වැය බරක් විය යුතු බව.

41උ. සභාව විසින් දරනු ලබන වියදම් ඒකාබද්ධ අරමුදලට වැයබරක් විය යුත්තේ ය.

සභාවේ තීරණවල අවසානාත්මක බව.

41ඌ. 126 වන ව්‍යවස්ථාවේ (1), (2), (4) වන සහ (5) වන ජේදයන් හි ඇති විධිවිධානවලට යටත්ව, සභාව විසින් එළඹෙන ලද යම් තීරණයක් හෝ කරන ලද යම් අනුමත කිරීමක් හෝ නිර්දේශයක් භාර ගැනීමට, විභාග කිරීමට හෝ තීරණයක් දීමට හෝ කවර වූ හේතුවක් මත හෝ කවර වූ හෝ ආකාරයකින් ප්‍රශ්න කිරීමට, කිසිදු අධිකරණයකට බලය හෝ අධිකරණ බලය නොමැති විය යුත්තේ ය. ඒ පත් කිරීම, තීරණය, අනුමතය හෝ නිර්දේශය සියලු කාර්ය සඳහා අවසානාත්මක හා තීරණාත්මක විය යුත්තේ ය.".

**3.** ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 52 වන ව්‍යවස්ථාව, ඒ ව්‍යවස්ථාවේ (7) වන ඡේදය පරිච්ඡින්න කිරීමෙන් සහ ඒ වෙනුවට පහත සඳහන් ඡේදය ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ :- ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 52 වන ව්‍යවස්ථාව සංශෝධනය කිරීම.

(7) (අ) පාර්ලිමේන්තු මහ ලේකම්වරයාගේ කාර්යාලය ද, පරිපාලන කටයුතු පිළිබඳ කොමසාරිස් (ඔම්බුඩ්ස්මන්) වරයා ගේ කාර්යාලය ද, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව ද, රාජ්‍ය සේවා කොමිෂන් සභාව ද, මැතිවරණ කොමිෂන් සභාව ද, ජාතික පොලිස් කොමිෂන් සභාව ද, අමාත්‍ය මණ්ඩලයේ ලේකම්වරයාගේ කාර්යාලය ද ; සහ

(ආ) විගණකාධිපති දෙපාර්තමේන්තුව,

මේ ව්‍යවස්ථාවේ කාර්ය සඳහා ආණ්ඩුවේ දෙපාර්තමේන්තුවක් නොවන්නා සේ සැලකිය යුත්තේ ය.

**4.** ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ IX වන පරිච්ඡේදය මෙයින් පරිච්ඡින්න කරනු ලබන අතර ඒ වෙනුවට පහත සඳහන් පරිච්ඡේදය මෙයින් ආදේශ කරනු ලැබේ :- ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ IX වන පරිච්ඡේදය ප්‍රතියෝජනය කිරීම.

"IX වන පරිච්ඡේදය

**විධායකය**

රාජ්‍ය සේවය

රාජ්‍ය සේවා කොමිෂන් සභාව. 54. (1) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ නිර්දේශය මත ජනාධිපතිවරයා විසින් පත් කරනු ලබන සාමාජිකයන් නව දෙනකුගෙන් සමන්විත (මේ පරිච්ඡේදයෙහි "කොමිෂන් සභාව" යනුවෙන් සඳහන් කරනු ලබන) රාජ්‍ය සේවා කොමිෂන් සභාවක් වන්නේ ය. ඒ සාමාජිකයන් අතුරෙන් සාමාජිකයන් තිදෙනකුට නොඅඩු සංඛ්‍යාවක් රජයේ නිලධරයන් වශයෙන් අවුරුදු පහළොවකට වැඩි පළපුරුද්දක් ඇති තැනැත්තන් විය යුත්තා හ. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ නිර්දේශය මත ජනාධිපතිවරයා විසින් එක් සාමාජිකයකු එහි සභාපතිවරයා ලෙස පත් කරනු ලැබිය යුත්තේ ය.

(2) යම් තැනැත්තෙක් පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු හෝ පළාත් සභා මන්ත්‍රීවරයකු හෝ පළාත් පාලන ආයතනයක සභිකයකු වේ නම් හෝ ඒ මන්ත්‍රීවරයකු හෝ සභිකයකු බවට පත් වුවහොත් හෝ ඒ තැනැත්තා කොමිෂන් සභාවේ සාමාජිකයකු ලෙස පත් කිරීම හෝ එසේ සාමාජිකයකු ලෙස තවදුරටත් කටයුතු කරගෙන යාම හෝ නොකළ යුත්තේ ය.

(3) රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සාමාජිකයකු ලෙස පත් කර ගනු ලැබීමට පෙරාතුව ම රාජ්‍ය සේවයේ රජයේ නිලධරයකුව හෝ අධිකරණ නිලධරයකුව සිටි සෑම තැනැත්තෙක් ම එම ධූරය දැරීම ඉහත කී පත්වීම බලාත්මක වූ විට, නතර වන අතර රාජ්‍ය නිලධරයකු හෝ අධිකරණ නිලධරයකු ලෙස තවදුරටත් පත් කරනු ලැබීමට ඒ තැනැත්තා සුදුස්සෙක් නොවන්නේ ය :

එසේ වුවද එවැනි යම් තැනැත්තෙක් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සාමාජිකයකුව සිටීම නතර වන තෙක් හෝ ඇවස්ථාවෝචිත පරිදි ඔහු රාජ්‍ය නිලධරයකුව හෝ අධිකරණ නිලධරයකුව සිටියේ නම් ඒ සේවයෙන් ඔහු විශ්‍රාම ගතයුතු වයසට එළඹීම ඒ තැනැත්තා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සාමාජිකත්වය දරද්දී සිදු වුවහොත් හෝ ඒ තැනැත්තාගේ ඒ සේවය වෙනුවෙන් ප්‍රදානය කරනු ලැබිය යුතු විශ්‍රාම වැටුප්, පාරිතෝෂික දීමනා හෝ වෙනත් දීමනාවකට අදාළ විධිවිධානයක කාර්ය සඳහා, අවස්ථාවෝචිත පරිදි, ඒ තැනැත්තා රාජ්‍ය නිලධරයකු හෝ අධිකරණ නිලධරයකු ලෙස ද රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් හිමි ධූරයක් දරන්නකු ලෙස ද සලකනු ලැබිය යුත්තේ ය.

(4) කොමිෂන් සභාවේ සාමාජිකයකු මේ ව්‍යවස්ථාවේ (2) වන ඡේදය යටතේ යම් නුසුදුසුවීමකට පාත්‍ර වුවහොත් හෝ ජනාධිපතිවරයා අමතා යවන ලියවිල්ලක් මගින්, නියමිත දිනයට පෙරාතුව ම ධූරයෙන් ඉල්ලා අස්වුවහොත් හෝ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ නිර්දේශය මත ජනාධිපතිවරයා විසින් ධූරයෙන් ඉවත් කරනු

ලැබුවහොත් හෝ චරිත දූෂණ වරදක් සම්බන්ධව අධිකරණයක් විසින් වරදකරු කරනු ලැබුවහොත් හෝ ඔහු ප්‍රජා අශක්තතාවන්ට යටත් කළ යුතු බවට යෝජනා සම්මතයක් 81 වන ව්‍යවස්ථාව යටතේ සම්මත කර ඇත්නම් හෝ මේ ව්‍යවස්ථාවේ (5) වන ඡේදය යටතේ ධුරය හැර යන ලද සේ සලකනු ලැබුවහොත් හෝ මිස, ඔහු පත් කරනු ලැබූ දින සිට අවුරුදු තුනක කාලයක් ධුරය දරන්නේ ය.

(5) කොමිෂන් සභාවේ සාමාජිකයකු ඒ කොමිෂන් සභාවේ සාමාජිකයකු ලෙස නැවත පත් කරනු ලැබීමට සුදුස්සකු වන නමුත් සාමාජිකයකු වශයෙන් ඔහුගේ ධුර කාලය ඉකුත් වීමෙන් පසුව රජයේ නිලධරයකු ලෙස හෝ අධිකරණ නිලධරයකු ලෙස නැවත පත් කරනු ලැබීමට සුදුස්සෙක් නොවන්නේ ය. කිසිම සාමාජිකයකු ධුර කාල සීමා දෙකකට වඩා කොමිෂන් සභාවේ ධුරය දැරීමට සුදුස්සෙක් නොවන්නේ ය.

(6) කොමිෂන් සභාවේ පූර්ව අවසරය ලබා නොගෙන කොමිෂන් සභාවේ අනුක්‍රමික රැස්වීම් තුනකට පැමිණ නොසිටින සාමාජිකයකු ඒ තුන්වන රැස්වීමේ දින සිට බලපවත්වන පරිදි ධුරය අත්හැර යනු ලැබුවාක් සේ සැලකිය යුතු අතර ඉන් පසුව කොමිෂන් සභාවේ සාමාජිකයකු ලෙස නැවත පත් කරනු ලැබීමට සුදුස්සෙක් නොවන්නේ ය.

(7) ජනාධිපතිවරයා විසින් කොමිෂන් සභාවේ සාමාජිකයකුට මාස දෙකක් නොඉක්මවන කාලයකට කොමිෂන් සභාවට අදාළ ඔහුගේ කාර්යවලින් නිවාඩු දෙනු ලැබිය හැකි අතර, රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සාමාජිකයකු වීමට සුදුසුකම් ඇති තැනැත්තකු, ඒ නිවාඩු කාලය සඳහා තාවකාලික සාමාජිකයකු වශයෙන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ නිර්දේශය මත පත් කරනු ලැබිය යුත්තේ ය.

(8) කොමිෂන් සභාවේ සාමාජිකයකුට පාර්ලිමේන්තුව විසින් නිශ්චය කරනු ලබන පාරිශ්‍රමික ගෙවිය යුත්තේ ය. කොමිෂන් සභාවේ සාමාජිකයකුට ගෙවන පාරිශ්‍රමික ඒකාබද්ධ අරමුදලට වැයබරක් වන්නේ ය. ඒ පාරිශ්‍රමික ඒ සාමාජිකයාගේ ධුර කාලය තුළ අඩු නොකළ යුත්තේ ය.

(9) කොමිෂන් සභාවේ යම් සාමාජික ධුරයක් හිස්ව තිබුණ ද ඒ නොතකා ක්‍රියා කිරීමට කොමිෂන් සභාවට බලය ඇත්තේ ය. තව ද එවැනි යම් පුරප්පාඩුවක් හෝ යම් සාමාජිකයකු පත් කිරීමෙහි ලා යම් දෝෂයක් හෝ තිබූ පමණින්, කොමිෂන් සභාවේ යම් ක්‍රියාවක් හෝ කටයුත්තක් හෝ තීරණයක් නිර්බල නොවන්නේ ය ; නිර්බල වන්නාක් සේ නොසැලකිය යුත්තේ ය.

(10) කොමිෂන් සභාවට ලේකම්වරයකු සිටිය යුතු අතර ඒ ලේකම්වරයා කොමිෂන් සභාව විසින් පත් කරනු ලැබිය යුත්තේ ය.

(11) කොමිෂන් සභාවේ සාමාජිකයකු දණ්ඩ නීති සංග්‍රහයේ IX වන පරිච්ඡේදයේ කාර්ය සඳහා රජයේ සේවකයකු ලෙස සලකනු ලැබිය යුත්තේ ය.

අමාත්‍ය මණ්ඩලයේ සහ කොමිෂන් සභාවේ බලතල හා කර්තව්‍ය.

55. (1) රජයේ නිලධරයන් පත් කිරීම, උසස් කිරීම, ස්ථාන මාරු කිරීම ඔවුන් විෂයයෙහි විනය පාලනය කිරීම සහ සේවයෙන් පහ කිරීම මෙයින් කොමිෂන් සභාව වෙත පවරනු ලැබිය යුත්තේ ය.

(2) නීතියෙන් පිහිටුවන ලද පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවල කර්තව්‍ය හා බලතල කොමිෂන් සභා විසින් හීන කරනු නොලැබිය යුත්තේ ය.

(3) මේ ව්‍යවස්ථාවේ (1) වන ඡේදයේ විධිවිධානවල කුමක් සඳහන්ව තිබුණ ද, සියලු දෙපාර්තමේන්තු ප්‍රධානයන් පත් කිරීම, උසස් කිරීම, ස්ථාන මාරු කිරීම, ඔවුන් විෂයයෙහි විනය පාලනය කිරීම සහ සේවයෙන් පහ කිරීම අමාත්‍ය මණ්ඩලය සතු වන අතර අමාත්‍ය මණ්ඩලය විසින් ඒ බලතල කොමිෂන් සභාවේ අදහස් විමසා දැනගැනීමෙන් පසුව ක්‍රියාවේ යෙදිය යුත්තේ ය.

(4) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ විධිවිධානවලට යටත්ව, රජයේ නිලධරයන් හා සම්බන්ධ සියලු ප්‍රතිපත්තිමය කාරණ සඳහා විධිවිධාන සැලසීම ද ඒ කාරණ තීරණය කිරීම ද අමාත්‍ය මණ්ඩලය විසින් කරනු ලැබිය යුත්තේ ය.

(5) කොමිෂන් සභාවේ බලතල සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම සහ ඉටු කිරීම සම්බන්ධයෙන් කොමිෂන් සභාව පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝගවලට අනුකූලව පාර්ලිමේන්තුවට වගකිව යුතු සහ උත්තර දිය යුතු අතර එක් එක් ලිත් වර්ෂයේ දී සිදු කරන ලද ස්වකීය කටයුතු පිළිබඳ වාර්තාවක් ඒ ඒ ලිත් වර්ෂය සඳහා පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබිය යුත්තේ ය.

කොමිෂන් සභාවේ කමිටු.

56. (1) කොමිෂන් සභාව විසින් නිශ්චිතව සඳහන් කරනු ලබන රාජ්‍ය සේවයේ යම් නිලධර ගණවලට අයත් නිලධරයන් පත් කිරීමේ, උසස් කිරීමේ, ස්ථාන මාරු කිරීමේ, ඔවුන් විෂයයෙහි විනය පාලනය කිරීමේ සහ සේවයෙන් පහ කිරීමේ බලතල කොමිෂන් සභාව විසින් පත් කරනු ලබන කොමිෂන් සභාවේ සාමාජිකයන් නොවන තැනැත්තන් තිදෙනකුගෙන් සමන්විත කමිටුවක් වෙත කොමිෂන් සභාව විසින් පවරනු ලැබිය හැක්කේ ය.

(2) එවැනි යම් කමිටුවක් පත් කිරීම, කොමිෂන් සභාව විසින් ගැසට් පත්‍රයේ පළ කරනු ලැබීමට සැලැස්විය යුත්තේ ය.

(3) එවැනි කමිටුවක රැස්වීම්වල කාර්ය පටිපාටිය සහ රැස්වීමක් සඳහා ගණපූරණය, කොමිෂන් සභාව විසින් තත් කාර්යය සඳහා සාදනු ලබන රීති වලින් නිශ්චය කරනු ලබන පරිදි විය යුත්තේ ය. කොමිෂන් සභාව විසින් ඒ රීති, ගැසට් පත්‍රයේ පළ කරනු ලැබීමට සැලැස්විය යුත්තේ ය.

(4) ඒ එක් එක් කමිටුවකට ලේකම්වරයකු සිටිය යුතු අතර ඒ ලේකම්වරයා කොමිෂන් සභාව විසින් පත් කරනු ලැබිය යුත්තේ ය.

රජයේ නිලධරයකු වෙත බලතල පැවරීම.

57. (1) කොමිෂන් සභාව විසින් නිශ්චිතව නියම කරන යම් ගණයක රජයේ නිලධරයන් පත් කිරීමේ, උසස් කිරීමේ, ස්ථාන මාරු කිරීමේ, ඔවුන් විෂයයෙහි

විනය පාලනය කිරීමේ සහ සේවයෙන් පහ කිරීමේ බලතල කොමිෂන් සභාව විසින් තීරණය කරනු ලැබිය හැකි යම් කොන්දේසි හා කාර්ය පාටිපාටිවලට යටත්ව කොමිෂන් සභාව විසින් රාජ්‍ය නිලධරයකුට පවරා දෙනු ලැබිය හැක්කේ ය.

(2) එවැනි යම් පවරා දීමක්, තත් කාර්යය සඳහා කොමිෂන් සභාව විසින් තීරණය කරනු ලබන කොන්දේසි හා කාර්ය පටිපාටි ද ඇතුළුව, ගැසට් පත්‍රයේ පළ කරනු ලැබීමට කොමිෂන් සභාව විසින් කටයුතු සලස්වනු ලැබිය යුත්තේ ය.

අභියාචනය කිරීමේ අයිතිවාසිකම.

58. (1) 56 වන ව්‍යවස්ථාව හෝ 57 වන ව්‍යවස්ථාව යටතේ, යම් කමිටුවක් හෝ නිලධරයකු හෝ විසින් තමා සම්බන්ධයෙන් කරන ලද උසස් කිරීමේ හෝ ස්ථාන මාරු කිරීමේ හෝ සේවයෙන් පහ කිරීමේ යම් නියමයකින් හෝ විනය කාරණයකට සම්බන්ධ වෙනත් යම් නියමයකින් අතෘප්තියට පත් යම් රජයේ නිලධරයකු විසින්, එම නියමයන්ට එරෙහිව අභියාචනයක් ඉදිරිපත් කිරීමට, අභියාචනයක් විභාග කිරීම සහ තීරණය කිරීමට අදාළ වූ කාර්ය පටිපාටිය සහ අභියාචනයක් විභාග කර නිම කිරීමට නියමිත කාලය සම්බන්ධයෙන් කොමිෂන් සභාව විසින් කලින් කල සාදනු ලබන රීතිවලට අනුකූලව කොමිෂන් සභාව වෙත අභියාචනය කළ හැක්කේ ය.

(2) එවැනි අභියාචනයක් කරනු ලැබූ විට, ඒ අභියාචනය කර ඇත්තේ යම් නියමයකට විරුද්ධව ද ඒ නියමය සුදුසු යයි කොමිෂන් සභාවට පෙනී යන පරිදි වෙනස් කිරීමේ, මද වශයෙන් වෙනස් කිරීමේ, ප්‍රත්‍යාදිෂ්ඨ කිරීමේ හෝ ස්ථිර කිරීමේ හෝ ඒ සම්බන්ධයෙන් විධාන දීමේ හෝ වැඩිදුර හෝ වෙනත් පරීක්ෂණයක් පවත්වන ලෙස නියම කිරීමේ බලය කොමිෂන් සභාවට ඇත්තේ ය.

(3) මේ ව්‍යවස්ථාවේ (1) වන ඡේදය යටතේ කොමිෂන් සභාව විසින් සාදන ලද රීති කොමිෂන් සභාව විසින් ගැසට් පත්‍රයේ පළ කරනු ලැබීමට සලස්වනු ලැබිය යුත්තේ ය.

පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරිය.

59. (1) අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් පත් කරනු ලබන පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරයක් වන්නේ ය.

(2) කොමිෂන් සභාව විසින් කරන ලද යම් නියමයක් හෝ තීරණයක් වෙනස් කිරීමට, සුළු වශයෙන් වෙනස් කිරීමට හෝ ප්‍රත්‍යාදිෂ්ට කිරීමට පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරයට බලය ඇත්තේ ය.

(3) අභියාචනයක් ඉදිරිපත් කළ හැකි කාලසීමාව ද ඇතුළුව ඒ විනිශ්චය අධිකාරවල සංයුතිය, බලතල සහ කාර්ය පටිපාටි සම්බන්ධයෙන් නීතියෙන් විධිවිධාන සලස්වනු ලැබිය යුත්තේ ය.

බලතල පවරා දී ඇති අවස්ථාවක කොමිෂන් සභාව ඒ බලතල ක්‍රියාවේ නොයෙදිය යුතු බව.

60. අවස්ථාවෝචිත පරිදි 56 වන ව්‍යවස්ථාව හෝ 57 වන ව්‍යවස්ථාව යටතේ පත් කරන ලද කමිටුවකට හෝ රජයේ නිලධරයකුට කොමිෂන් සභාවේ යම් බලතල පවරා දෙනු ලැබූ විට, එසේ කොමිෂන් සභාවේ බලතල පවරා දීම වලංගුව පවතින තාක් කල්, ඒ බලතල පවරා දෙන ලද්දේ රාජ්‍ය සේවයේ යම් නිලධර ගණවලට අයත් නිලධරයන් සම්බන්ධයෙන් ද ඒ නිලධර ගණවලට අයත් නිලධරයන් සම්බන්ධව 58 වන ව්‍යවස්ථාවේ (1) වන හා (2) වන ඡේදවල විධිවිධානවලට යටත්ව, කොමිෂන් සභාව විසින් ඒ කර්තව්‍ය හෝ කාර්ය කිරීම හෝ ඉටු කිරීම නොකළ යුත්තේ ය.

රැස්වීම්වල කාර්ය පටිපාටිය.

61. (1) කොමිෂන් සභාවේ රැස්වීමක් සඳහා ගණපූරණය සාමාජිකයන් පස් දෙනකු විය යුත්තේ ය.

(2) කොමිෂන් සභාවේ සියලු තීරණ අදාළ රැස්වීමට පැමිණ සිටින සාමාජිකයන්ගේ බහුතර ඡන්දයෙන් ගනු ලැබිය යුත්තේ ය. ඡන්දය සම සමව ලැබුණු අවස්ථාවක දී මූලසුන දරන සාමාජිකයාට තීරණ ඡන්දයක් ඇත්තේ ය.

(3) කොමිෂන් සභාවේ සභාපතිවරයා කොමිෂන් සභාවේ සියලු රැස්වීම්වල මූලාසනය දැරිය යුත්තේ ය. ඔහු පැමිණ නොමැති විටක, රැස්වීමට පැමිණ සිටින සාමාජිකයන් විසින් ඔවුන් අතුරෙන් තෝරා පත් කර ගන්නා සාමාජිකයකු ඒ රැස්වීමේ මූලසුන දැරිය යුත්තේ ය.

නඩු කටයුතුවලින් මුක්තිය.

61අ. 126 වන ව්‍යවස්ථාවේ (1) වන, (2) වන, (3) වන, (4) වන සහ (5) වන ඡේදයන්හි විධිවිධානවලට යටත්ව කමිටුවක් විසින් හෝ යම් රජයේ නිලධරයකු විසින් මේ පරිච්ඡේදය යටතේ හෝ වෙනත් යම් නීතියක් යටතේ ඒ කොමිෂන් සභාව වෙත පැවරී ඇති හෝ පැනවී ඇති, නැතහොත් කමිටුව වෙත හෝ රාජ්‍ය නිලධරයා වෙත පවරා දී ඇති යම් බලයක් හෝ කාර්යයක් ප්‍රකාර කරන ලද යම් නියමයක් හෝ තීරණයක් විභාග කිරීමට හෝ තීන්දුවක් දීමට හෝ කවර වූ හෝ ආකාරයකින් ඒ පිළිබඳ ප්‍රශ්න කිරීමට කිසිම අධිකරණයකට හෝ විනිශ්චය අධිකාරයකට බලය හෝ අධිකරණ බලය නොමැත්තේ ය.

බලාත්මකව පවතින රීති සහ නියෝග ඉතිරි කර තබා ගැනීම.

61ආ. කොමිෂන් සභාව විසින් අන්‍යාකාරයකින් විධිවිධාන සලස්වනු ලබන තෙක්, මේ පරිච්ඡේදය ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයේ දී රාජ්‍ය සේවයට අදාළව බලාත්මකව පැවති සියලු රීති, නියෝග හා කාර්ය පටිපාටි, මේ පරිච්ඡේදය යටතේ රාජ්‍ය සේවයට සම්බන්ධව සාදනු ලැබූ හෝ විධිවිධාන සලස්වනු ලැබූ රීති, නියෝග හා කාර්ය පටිපාටි වූවාක් සේ අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, බලාත්මකව පවතින ලෙස සැලකිය යුත්තේ ය.

කොමිෂන් සභාවේ කටයුතුවලට අයුතු ලෙස මැදිහත් වීම.

61ඈ. (1) කොමිෂන් සභාවේ හෝ කොමිෂන් සභාව විසින් මේ පරිච්ඡේදය යටතේ යම් බලයක් පවරා දෙනු ලැබූ කොමිෂන් සභාවේ යම් කමිටුවක හෝ රජයේ නිලධරයකුගේ හෝ යම් තීරණයක් කෙරෙහි, තමාගේ නීත්‍යනුකූල රාජකාරි කටයුතුවල දී හැර, කෙළින්ම හෝ අන්‍යාකාරයකින්, තමන් විසින් ම හෝ වෙනත් යම් තැනැත්තකු මගින් හෝ වෙනත් යම් තැනැත්තකු සමග හෝ කවර හෝ ආකාරයකින් බලපෑමක් කරන්නා වූ හෝ බලපෑමක් කිරීමට තැත් කරන්නා වූ හෝ අයුතු ලෙස මැදිහත් වන්නා වූ හෝ කොමිෂන් සභාවේ හෝ කමිටුවක සාමාජිකයකුට එලෙස බලපෑමක් කරන්නා වූ සෑම තැනැත්තෙක් ම වරදකට වරදකරු වන අතර වරදකරු කරනු ලැබූ විට රුපියල් එක් ලක්ෂයක් නොඉක්මවන දඩයකට හෝ අවුරුදු හතක් නොඉක්මවන කාලයකට බන්ධනාගාරගත කරනු ලැබීමට හෝ ඒ දඩය හා බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකටම හෝ ඔහු යටත් වන්නේ ය.

(2) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154ග ව්‍යවස්ථාව යටතේ පිහිටුවන ලද සෑම මහාධිකරණයකට ම, මේ ව්‍යවස්ථාවේ (1) වන ඡේදයේ සඳහන් යම් කාරණයක් විභාග කොට විනිශ්චය කිරීමට අධිකරණ බලය ඇත්තේ ය.

නිල ප්‍රතිඥාව හෝ දිවුරුම.

61ඇ. මේ පරිච්ඡේදයේ සඳහන් කවර හෝ ධුරයකට පත් කරනු ලැබූ තැනැත්තකු, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ හතර වන උපලේඛනයේ දැක්වෙන ප්‍රතිඥාව දී ඊට අත්සන් තබන තෙක් හෝ දිවුරුම දී ඊට අත්සන් තබන තෙක් හෝ ස්වකීය ධුරයට අයත් කාර්යයන්හි නොයෙදිය යුත්තේ ය.

ජනාධිපතිවරයා විසින් කරන පත් කිරීම.

61ඉ. ජනාධිපතිවරයා විසින් –

(අ) යුද හමුදාපතිවරයා, නාවුක හමුදාපතිවරයා සහ ගුවන් හමුදාපතිවරයා පත් කිරීම ද ;

(ආ) 41ඇ ව්‍යවස්ථාවේ විධිවිධානවලට යටත්ව නීතිපතිවරයා සහ පොලිස්පතිවරයා පත් කිරීම ද,

කළ යුත්තේ ය.

අර්ථ නිරූපණය.

61ඊ. මේ පරිච්ඡේදයේ කාර්ය සඳහා "රජයේ නිලධරයා" යන්නට යුදහමුදා, නාවුක හමුදා හෝ ගුවන් හමුදා සාමාජිකයකු හෝ මැතිවරණ කොමිෂන් සභාව විසින් පත් කරන ලද මැතිවරණ කොමිෂන් සභාවේ නිලධරයකු හෝ ජාතික පොලිස් කොමිෂන් සභාව විසින් පත් කරන ලද පොලිස් නිලධරයකු හෝ අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් පත් කරන ලද උපලේඛනගත රජයේ නිලධරයකු හෝ ඇතුළත් නොවන්නේ ය.".

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 65 වන ව්‍යවස්ථාව සංශෝධනය කිරීම.

**5.** ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 65 වන ව්‍යවස්ථාව මෙහි පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :-

(1) ඒ ව්‍යවස්ථාවේ (1) වන ඡේදයේ "ජනාධිපතිවරයා විසින් පත් කරනු ලබන්නේ ය" යන වචන වෙනුවට "ජනාධිපතිවරයා විසින් 41ඇ ව්‍යවස්ථාවේ විධිවිධානවලට යටත්ව පත් කරනු ලබන්නේ ය". යන වචන ආදේශ කිරීමෙන් ; සහ

(2) ඒ ව්‍යවස්ථාවේ (6) වන ඡේදයේ "තැනැත්තකු පත් කිරීමට ජනාධිපතිවරයාට බලය ඇත්තේ ය". යන වචන වෙනුවට "41ඇ ව්‍යවස්ථාවේ විධිවිධානවලට යටත්ව තැනැත්තකු පත් කිරීමට ජනාධිපතිවරයාට බලය ඇත්තේ ය". යන වචන ආදේශ කිරීමෙන්.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 89 වන ව්‍යවස්ථාව සංශෝධනය කිරීම.

**6.** ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 89 වන ව්‍යවස්ථාව එහි (ඒ) ඡේදයේ "116 වන ව්‍යවස්ථාව" යන වචන සහ ඉලක්කම් වෙනුවට "අවස්ථාවෝචිත පරිදි 116 වන ව්‍යවස්ථාව හෝ 111ඇ ව්‍යවස්ථාව" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

**7.** ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 91 වන ව්‍යවස්ථාවේ (1) වන ඡේදය මෙහි පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:- ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 91 වන ව්‍යවස්ථාව සංශෝධනය කිරීම.

(1) එහි (ඇ) (iv) අනුඡේදයට ඉක්බිතිව ම මෙහි පහත දැක්වෙන අලුත් අනුඡේදය ඇතුළත් කිරීමෙන් :—

"(ivඅ) පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සාමාජිකයෙක්;";

(2) එහි (ඇ) (V) වන අනුඡේදය වෙනුවට මෙහි පහත දැක්වෙන අලුත් අනුඡේදය ආදේශ කිරීමෙන් :—

"(V) මැතිවරණ කොමසාරිස් ජනරාල්වරයා; "

(3) එහි (ඇ) (V) වන අනුඡේදයට ඉක්බිතිව ම, මෙහි පහත දැක්වෙන අලුත් අනුඡේද ඇතුළත් කිරීමෙන් :—

"(Vඅ) මැතිවරණ කොමිෂන් සභාවේ සාමාජිකයෙක් ;

(Vආ) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ සාමාජිකයෙක් ;

(Vඇ) ජාතික පොලිස් කොමිෂන් සභාවේ සාමාජිකයෙක්.".

සහ

(4) ඒ ඡේදයේ (ඇ) (viii) වන අනුඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් අනුඡේදය ඇතුළත් කිරීමෙන් :-

"(viiiඅ) 1988 පෙබරවාරි 01 වන දිනට පසුව ඇති කරන ලද ධුරයක් වූ ද, ධුරය ඇති කරන ලද දිනයේ දී ඒ ධුරයේ වැටුප් පරිමාණයෙහි ආරම්භක වැටුප, පාර්ලිමේන්තුව විසින් යෝජනා සම්මතයක් මගින් තීරණය කරනු ලැබූ වැටුපට නැතහොත් ඉන් පසුව සිදු කරන ලද යම් වැටුප් පරිමාණ ප්‍රතිශෝධනයක් යටතේ එකී ආරම්භක වැටුපට අනුරූප වන වෙනත් යම් වාර්ෂික වැටුප් ප්‍රමාණයකට නොඅඩු වූ ද යම් ධුරයක් දරන්නා වූ, පළාත් රාජ්‍ය සේවයේ නිලධරයෙක්.".

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 103 වන ව්‍යවස්ථාව සහ 104 වන ව්‍යවස්ථාව පරිච්ඡින්න කිරීම.

**8.** ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 103 වන ව්‍යවස්ථාව සහ 104 වන ව්‍යවස්ථාව මෙයින් පරිච්ඡින්න කරනු ලැබේ.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ XIVඅ අලුත් පරිච්ඡේදය ඇතුළත් කිරීම.

**9.** ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 102 වන ව්‍යවස්ථාවට ඉක්බිතිව ම මෙහි පහත දැක්වෙන අලුත් පරිච්ඡේදය ඇතුළත් කරනු ලබන අතර එය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ XIVඅ පරිච්ඡේදය ලෙස බලාත්මක වන්නේ ය.

"XIVඅ පරිච්ඡේදය

**මැතිවරණ කොමිෂන් සභාව**

මැතිවරණ කොමිෂන් සභාවේ සංයුතිය.

103. (1) (මේ පරිච්ඡේදයෙහි "කොමිෂන් සභාව" යනුවෙන් සඳහන් කරනු ලබන) මැතිවරණ කොමිෂන් සභාවක් තිබිය යුත්තේ ය. කොමිෂන් සභාව වෘත්තීන් හි හෝ පරිපාලන හෝ අධ්‍යාපන ක්ෂේත්‍රවල විශිෂ්ටතා හිමිකරගෙන සිටින තැනැත්තන් අතුරෙන්, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ නිර්දේශය මත ජනාධිපතිවරයා විසින් පත් කරනු ලබන සාමාජිකයන් පස් දෙනකුගෙන් සමන්විත විය යුත්තේ ය. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ නිර්දේශය මත ඔවුන් අතුරෙන් එක් සාමාජිකයකු, කොමිෂන් සභාවේ සභාපතිවරයා ලෙස ජනාධිපතිවරයා විසින් පත් කරනු ලැබිය යුත්තේ ය.

(2) නිදහස් හා සාධාරණ ඡන්ද විමසීම් සහ ජනමත විචාරණ පැවැත්වීම කොමිෂන් සභාවේ පරමාර්ථය විය යුත්තේ ය.

(3) යම් තැනැත්තකු පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු, පළාත් සභා මන්ත්‍රීවරයකු හෝ පළාත් පාලන ආයතනයක සභිකයකු නම් හෝ එවැන්නකු බවට පත් වේ නම් හෝ, අධිකරණ නිලධරයකු හෝ රජයේ නිලධරයකු නම් හෝ එවැන්නකු වශයෙන් පත් කරනු ලැබුවේ නම් හෝ, කවර වුවද

තත්ත්වයකින් රජයේ සේවයේ යෙදී සිටි නම් හෝ රජයේ සේවයට ඇතුළු වේ නම් එවැනි කිසිදු තැනැත්තකු කොමිෂන් සභාවේ සාමාජිකයකු වශයෙන් පත් කිරීම හෝ එසේ සාමාජිකයකු ලෙස තවදුරටත් කටයුතු කර ගෙන යාම හෝ නොකළ යුත්තේ ය.

(4) ශ්‍රේෂ්ඨාධිකරණ විනිශ්චයකාරවරයන් සහ අභියාචනාධිකරණයේ විනිශ්චයකාරවරයන් ධුරයෙන් ඉවත් කිරීම පිළිබඳව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ සහ වෙනත් නීතිවල විධිවිධාන, මැතිවරණ කොමිෂන් සභාවේ සාමාජිකයන් ධුරයෙන් ඉවත් කිරීම සම්බන්ධයෙන් අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, අදාළ විය යුත්තේ ය.

(5) කොමිෂන් සභාවේ සාමාජිකයකු, කොමිෂන් සභාවේ පූර්ව අවසරය නොමැතිව, කොමිෂන් සභාවේ අනුක්‍රමික රැස්වීම් තුනකට නොපැමිණියහොත් ඔහු පැමිණ නොසිටි ඒ රැස්වීම්වලින් තුන්වන රැස්වීමේ දින සිට ක්‍රියාත්මක වන පරිදි ඔහු ධුරය අතහැර ගියාක් සේ සැලකිය යුත්තේ ය.

(6) කොමිෂන් සභාවේ සාමාජිකයකු මේ ව්‍යවස්ථාවේ (3) වන ඡේදය යටතේ යම් නුසුදුසුවීමකට පාත්‍ර වුවහොත් හෝ ජනාධිපතිවරයා අමතා යවන ලියවිල්ලක් මගින් ධුරයෙන් ඉල්ලා අස්වුවහොත් හෝ මේ ව්‍යවස්ථාවේ (4) වන ඡේදය යටතේ ධුරයෙන් ඉවත් කරනු ලැබුවහොත් හෝ චරිත දූෂණ වරදක් සම්බන්ධයෙන් අධිකරණයක් විසින් වරදකරු කරනු ලැබුවහොත් හෝ ඔහු ප්‍රජා අශක්නුතාවන්ට යටත් කළ යුතු බවට යෝජනා සම්මතයක් 81 වන ව්‍යවස්ථාව යටතේ සම්මත කර ඇත්නම් හෝ මේ ව්‍යවස්ථාවේ (5) වන ඡේදය යටතේ ධුරය හැර ගියාක් සේ සලකනු ලබන්නේ නම් හෝ මිය, ඔහු ධුරයට පත් කරනු ලැබූ දින සිට අවුරුදු පහක කාලයක් ධුරය දැරිය යුත්තේ ය.

(7) ජනාධිපතිවරයා විසින් කොමිෂන් සභාවේ සාමාජිකයකුට කොමිෂන් සභාවට අදාළ ඔහුගේ රාජකාරි කටයුතුවලින් මාස දෙකක් නොඉක්මවන කාලයක් සඳහා තාවකාලිකව නිවාඩු දෙනු ලැබිය හැකි අතර, කොමිෂන් සභාවේ සාමාජිකයකු වීමට සුදුසුකම් ඇති තැනැත්තකු ඒ නිවාඩු කාලසීමාව සඳහා කොමිෂන් සභාවේ සාමාජිකයකු වශයෙන් පත් කරනු ලැබිය හැක්කේ ය. ඒ සෑම පත් කිරීමක් ම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ නිර්දේශය මත විය යුත්තේ ය.

(8) කොමිෂන් සභාවේ සාමාජිකයකුට පාර්ලිමේන්තුවේ යෝජනා සම්මතයක් මගින් නිශ්චය කරනු ලබන යම් පාරිශ්‍රමික ගෙවනු ලැබිය යුත්තේ ය. කොමිෂන් සභාවේ සාමාජිකයකුට ගෙවිය යුතු පාරිශ්‍රමික ඒකාබද්ධ අරමුදලට වැයබරක් විය යුතු අතර ඒ සාමාජිකයාගේ ධුර කාලය තුළ ඒ පාරිශ්‍රමිකය අඩු නොකළ යුත්තේ ය.

(9) දණ්ඩ නීති සංග්‍රහයේ IX වන පරිච්ඡේදයේ අර්ථානුකූලව සහ ඒ කාර්යය සඳහා කොමිෂන් සභාවේ සියලුම සාමාජිකයන් රජයේ සේවකයන් ලෙස සලකනු ලැබිය යුත්තේ ය.

කොමිෂන් සභාවේ රැස්වීම්.

104. (1) කොමිෂන් සභාවේ යම් රැස්වීමක් සඳහා ගණපූරණය සාමාජිකයන් තිදෙනකුගෙන් සමන්විත විය යුත්තේ ය.

(2) (අ) කොමිෂන් සභාවේ සභාපතිවරයා කොමිෂන් සභාවේ රැස්වීම්වල මූලසුන දැරිය යුත්තේ ය. සභාපතිවරයා කොමිෂන් සභාවේ යම් රැස්වීමකට පැමිණ නොසිටියහොත් පැමිණ සිටින සාමාජිකයන් විසින් ඔවුන් අතුරෙන් තෝරා පත් කර ගන්නා සාමාජිකයකු විසින් ඒ රැස්වීමේ මූලසුන දැරිය යුත්තේ ය.

(ආ) කොමිෂන් සභාවේ තීරණ, ඒ ඒ තීරණ ගනු ලබන රැස්වීමට පැමිණ ඡන්දය දෙන්නා වූ සාමාජිකයන්ගේ බහුතර ඡන්දයෙන් ගනු ලැබිය යුතු අතර යම් හෙයකින් සම සමව ඡන්දය ලැබුණු අවස්ථාවක දී ඒ රැස්වීමේ සභාපතිවරයාට තීරණ ඡන්දයක් තිබිය යුත්තේ ය.

(3) කොමිෂන් සභාවේ සාමාජිකත්වයේ යම් පුරප්පාඩුවක් තිබුණ ද ඒ නොතකා ක්‍රියා කිරීමට කොමිෂන් සභාවට බලය ඇත්තේ ය. එවැනි පුරප්පාඩුවක් තිබූ පමණින් ම හෝ යම් සාමාජිකයකු පත් කිරීමෙහි ලා දෝෂයක් තිබූ පමණින් ම, කොමිෂන් සභාවේ යම් ක්‍රියාවක් හෝ කටයුත්තක් හෝ තීරණයක් නිර්බල නොවන්නේ ය ; නිර්බල වන්නේ යයි නොසැලකිය යුත්තේ ය.

තීරණවල අවසානාත්මක භාවය සහ නඩු කටයුතුවලින් මුක්තිය.

104අ. 126 වන ව්‍යවස්ථාවේ (1) ඡේදය සහ 104ඎ ව්‍යවස්ථාව සහ 130 වන ව්‍යවස්ථාව යටතේ ශ්‍රේෂ්ඨාධිකරණය වෙත පවරා දී ඇති අධිකරණ බලයට සහ 144 වන ව්‍යවස්ථාව යටතේ අභියාචනාධිකරණය වෙත පවරා දී ඇති අධිකරණ බලයට හා ඡන්ද පෙත්සම් හෝ ජනමතවිචාරණ පිළිබඳ පෙත්සම් අසා තීරණය කිරීම සඳහා යම් නීතියකින් යම් අධිකරණයක් වෙත පවරා දී ඇති අධිකරණ බලයට යටත්ව,–

(අ) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ කොමිෂන් සභාව විසින් කරන ලද හෝ ගනු ලැබූ හෝ කරන ලදැයි නැතහොත් ගන්නා ලදැයි කියනු ලබන යම් තීරණයක්, විධානයක් හෝ ක්‍රියාවක් සම්බන්ධයෙන් පැමිණිල්ලක් කවර හේතුවක් නිසා වුවද කවර ආකාරයකින් වුවද භාර ගැනීම හෝ ඇසීම හෝ තීරණය කිරීම හෝ ප්‍රශ්න කිරීමට පාත්‍ර කිරීම සඳහා බලය හෝ අධිකරණ බලය කිසිදු අධිකරණයකට නැත්තේ ය. කොමිෂන් සභාවේ තීරණ, විධාන හෝ ක්‍රියා අවසානාත්මක සහ තීරණාත්මක විය යුත්තේ ය ; සහ

(ආ) කොමිෂන් සභාවේ යම් සාමාජිකයකු හෝ නිලධරයකු හෝ විසින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ හෝ අවස්ථාවෝචිත පරිදි යම් ඡන්ද විමසීමක් පැවැත්වීම හෝ ජනමත විචාරණයක් පැවැත්වීම හා

සම්බන්ධ යම් නීතියක් යටතේ ස්වකීය කාර්ය ඉටු කිරීමේ දී හෝ තම කර්තව්‍ය සිදු කිරීමේ දී ඔහු විසින් සද්භාවයෙන් කරන ලද හෝ සද්භාවයෙන් කරන ලදැයි කියනු ලබන යම් ක්‍රියාවක් හෝ දෙයක් සම්බන්ධයෙන් ඒ සාමාජිකයාට හෝ නිලධරයාට විරුද්ධව කිසිදු සිවිල් නඩුවක් හෝ නඩු කටයුත්තක් නොපවරනු ලැබිය යුත්තේ ය.

මැතිවරණ කොමිෂන් සභාවේ බලතල, කාර්ය සහ කර්තව්‍ය.

104ආ. (1) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් සහ ජනාධිපතිවරයා තෝරා පත් කර ගැනීම, පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන් තෝරා පත් කර ගැනීම, පළාත් සභා මන්ත්‍රීවරයන් තෝරා පත් කර ගැනීම, පළාත් පාලන ආයතනවල සභිකයන් තෝරා පත් කර ගැනීම සහ ජනමත විචාරණයක් පැවැත්වීම සම්බන්ධයෙන් තත්කාලයේ බලපවත්නා නීතියක් මගින්,–

(අ) කොමිෂන් සභාව ; හෝ

(ආ) මැතිවරණ කොමසාරිස් ජනරාල්වරයා,

වෙත පවරා දී ඇති හෝ පනවා ඇති හෝ සියලු බලතල, කාර්ය සහ කර්තව්‍ය කොමිෂන් සභාව විසින් ක්‍රියාත්මක කරනු ලැබිය යුත්තේ ද ඉටු කරනු ලැබිය යුත්තේ ද සිදු කරනු ලැබිය යුත්තේ ද වන්නේ ය. එවැනි ඡන්ද විමසීම්වල සහ ජනමත විචාරණවල කාර්ය සඳහා ඡන්ද හිමි නාමලේඛන පිළියෙල කිරීම සහ ප්‍රතිශෝධනය කිරීම ද එම ඡන්ද විමසීම් පැවැත්වීම ද එකී බලතලවලට, කාර්යවලට සහ කර්තව්‍යවලට ඇතුළත් වන නමුත් ඒවාටම පමණක් සීමා නොවන්නේ ය.

(2) එවැනි යම් ඡන්ද විමසීමක් හෝ ජනමත විචාරණයක් පැවැත්වීමට අදාළ සියලු ම නීති බලාත්මක කිරීම, සුරක්ෂිත කිරීම කොමිෂන් සභාවේ

කාර්යය විය යුතු අතර එසේ ඒ නීති බලාත්මක කිරීම සුරක්ෂිත කිරීමෙහි ලා කොමිෂන් සභාවේ සහයෝගය දැක්වීම ඒ නීති බලාත්මක කිරීම භාරව සිටින සියලුම රජයේ බලධරයන්ගේ කාර්ය විය යුත්තේ ය.

(3) කොමිෂන් සභාවේ බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම හා ඉටු කිරීම සම්බන්ධයෙන් පාර්ලිමේන්තු ස්ථාවර නියෝගවල විධිවිධානවලට අනුකූලව කොමිෂන් සභාව පාර්ලිමේන්තුවට වගකිව යුතු සහ උත්තර දිය යුතු අතර, එක් එක් ලිත් වර්ෂයේ දී සිදු කරන ලද ස්වකීය කටයුතු පිළිබඳ වාර්තාවක් ඒ වර්ෂය සඳහා පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබිය යුත්තේ ය.

(4) (අ) මැතිවරණයක් පවත්වනු ලබන කාල පරිච්ඡේදය තුළ දී, රජයට හෝ යම් රාජ්‍ය සංස්ථාවකට හෝ අයත් යම් නිශ්චල හෝ චංචල දේපලක්-

(i) ඒ ඡන්ද විමසීමේ දී තරග කරන යම් අපේක්ෂකයකු හෝ යම් දේශපාලන පක්ෂයක් හෝ ස්වාධීන කණ්ඩායමක් හෝ තෝරා පත් කර ගැනීම, ප්‍රවර්ධනය කිරීමේ හෝ වළක්වාලීමේ කාර්ය සඳහා භාවිත කිරීම ;

(ii) ඒ ඡන්ද විමසීමේ දී තරග කරන යම් අපේක්ෂකයකු හෝ යම් දේශපාලන පක්ෂයක් හෝ යම් ස්වාධීන කණ්ඩායමක් හෝ විසින් භාවිත කිරීම,

කොමිෂන් සභාවේ උපදෙස් මත, කොමිෂන් සභාවේ සභාපතිවරයා හෝ මැතිවරණ කොමසාරිස් ජනරාල්වරයා හෝ විසින් යැවෙන ලිඛිත විධානයක් මගින්, තහනම් කිරීමේ බලය කොමිෂන් සභාවට ඇත්තේ ය.

(ආ) එවැනි විධානයකට අනුකූලවීම සහ එය ක්‍රියාත්මක කිරීම, තත්කාලයේ ඒ දේපල භාරව සිටින හෝ ඒ දේපලේ පාලනය දරන හෝ සෑම තැනැත්තකුගේ ම හෝ සෑම නිලධරයකුගේ ම කාර්යය විය යුත්තේ ය.

(5) (අ) ඡන්ද විමසීමක් හෝ ජනමත විචාරණයක් පැවැත්වීම විෂයයෙහි ලා නිදහස් හා සාධාරණ ඡන්ද විමසීමක් පැවැත්වීම සහතික කිරීම සඳහා අවශ්‍ය යයි කොමිෂන් සභාව විසින් සලකනු ලබන උපමාන, අවස්ථාවෝචිත පරිදි, කොමිෂන් සභාව විසින් උචිත යයි සලකනු ලබන යම් ගුවන් විදුලි හෝ රූපවාහිනී සේවයක් පවත්වා ගෙන යන්නකු හෝ යම් ප්‍රවෘත්ති පත්‍රයක අයිතිකරුවකු හෝ ප්‍රකාශකයකු වෙත කලින් කල නිකුත් කිරීමේ බලය කොමිෂන් සභාවට ඇත්තේ ය.

(ආ (අ) අනුඡේදය යටතේ, ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාවේ සභාපතිවරයා වෙත හෝ ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාවේ සභාපතිවරයා වෙත නිකුත් කරනු ලැබූ උපමාන අනුව ක්‍රියා කිරීම සහතික කෙරෙන සියලු පියවර ගැනීම ඒ සභාපතිවරයන්ගේ කාර්යය විය යුත්තේ ය.

(ඇ) (අ) අනුඡේදය යටතේ කොමිෂන් සභාව විසින් නිකුත් කරන ලද යම් උපමාන අවස්ථාවෝචිත පරිදි, ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාව හෝ ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාව හෝ විසින් උල්ලංඝනය කරනු ලැබූ අවස්ථාවක දී, නමින් හෝ නිලයෙන් හෝ නිසි බලධරයකු කොමිෂන් සභාව විසින් පත් කරනු ලැබිය හැක්කේ ය. එම නිසි බලධරයා පත් කරනු ලැබූ දින සිට, සියලු ම දේශපාලන විකාශන හෝ ඡන්ද විමසීම කෙරෙහි බලපාන්නේ යයි කොමිෂන් සභාවේ මතය වන වෙනත් යම් විකාශනයක්

සම්බන්ධයෙන්, අවස්ථාවෝචිත පරිදි ශුවන් විදුලි සංස්ථාවේ හෝ රූපවාහිනී සංස්ථාවේ හෝ කළමනාකරණය ඒ ඡන්ද විමසීම අවසන් වනතෙක් ඒ නිසි බලධරයා යටතට ගනු ලැබිය යුතු අතර නිසි බලධරයා විසින් පවරා ගන්නා ලද කළමනාකරණය හා සම්බන්ධ හෝ ඊට අදාළ කිසි කර්තව්‍යයක්, ඒ කාලසීමාව තුළ දී ශ්‍රී ලංකා ශුවන් විදුලි සංස්ථාව සහ ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාව විසින් ඉටු නොකළ යුත්තේ ය.

(ඇ) (ඇ) අනුඡේදය යටතේ පත් කරන ලද නිසි බලධරයාගේ බලතල සහ කර්තව්‍ය පාර්ලිමේන්තුව විසින් නීති මගින් සලස්වනු ලැබිය යුත්තේ ය.

කොමිෂන් සභාව විසින් පොලිසිය යෙදවීම.

104ඈ. (1) අවස්ථාවෝචිත පරිදි, ඡන්ද විමසීමක් පැවැත්වීම සඳහා නියමයක් හෝ ජනමත විචාරණයක් පැවැත්වීමට නියම කරමින් ප්‍රකාශනයක් හෝ කරනු ලැබූ විට, අවස්ථාවෝචිත පරිදි, ඒ ඡන්ද විමසීම හෝ ජනමත විචාරණය හෝ පැවැත්වීම සඳහා කොමිෂන් සභාවට අවශ්‍ය පහසුකම් සහ පොලිස් නිලධරයන් සංඛ්‍යාව කොමිෂන් සභාව විසින් පොලිස්පතිවරයාට දැනුම් දිය යුත්තේ ය.

(2) මේ ව්‍යවස්ථාවේ (1) වන ඡේදය යටතේ කරනු ලැබූ දැනුම්දීමක නිශ්චිතව සඳහන් පහසුකම් සහ පොලිස් නිලධරයන්, පොලිස්පතිවරයා විසින් කොමිෂන් සභාවට ලබාදිය යුත්තේ ය.

(3) කොමිෂන් සභාව වෙත සපයන ලද පොලිස් නිලධරයන් සහ පහසුකම් අවස්ථාවෝචිත පරිදි ඡන්ද විමසීමක් හෝ ජනමත විචාරණයක් පැවැත්වීම නිදහස්ව සහ සාධාරණව ප්‍රවර්ධනය කිරීම සඳහා සැලසුම්ගත ආකාරයකින් කොමිෂන් සභාව විසින් යොදවාගනු ලැබිය යුත්තේ ය.

(4) මේ ව්‍යවස්ථාවේ (2) වන ඡේදය යටතේ කොමිෂන් සභාව වෙත සපයන ලද සෑම පොලිස් නිලධරයකු ම, ඡන්ද විමසීමක කාලය තුළ දී කොමිෂන් සභාවට වගකිවයුතු අතර කොමිෂන් සභාවේ විධානය සහ පාලනය යටතේ ක්‍රියා කළ යුත්තේ ය.

(5) මේ ව්‍යවස්ථාව යටතේ කොමිෂන් සභාව වෙත සපයන ලද යම් පොලිස් නිලධරයකු විසින් කොමිෂන් සභාවේ විධානයක් ප්‍රකාර කොමිෂන් සභාව යටතේ කර්තව්‍ය ඉටු කිරීමේ දී හෝ සද්භාවයෙන් කරන ලද යම් නීත්‍යනුකූල ක්‍රියාවක් හෝ දෙයක් සම්බන්ධයෙන් ඒ පොලිස් නිලධරයාට විරුද්ධව යම් සිවිල් නඩුවක් හෝ නඩු කටයුත්තක් පවරනු නොලැබිය යුත්තේ ය.

සන්නද්ධ හමුදා යෙදවීම.

104ඇ. අවස්ථාවෝචිත පරිදි, ඡන්ද විමසීමක් පැවැත්වීම සඳහා නියමයක් හෝ ජනමත විචාරණයක් පැවැත්වීමට නියම කෙරෙන ප්‍රකාශනයක් හෝ කරනු ලැබූ විට, අවස්ථාවෝචිත පරිදි, නිදහස් හා සාධාරණ ඡන්ද විමසීමක් හෝ ජනමත විචාරණයක් හෝ පැවැත්වීමට අහිතකර විය හැකි යම් ක්‍රියා හෝ සිද්ධි වැළැක්වීම හෝ පාලනය කිරීම හෝ සඳහා ජනරජයේ සන්නද්ධ හමුදා යෙදවීම සම්බන්ධයෙන් කොමිෂන් සභාව විසින් ජනාධිපතිවරයා වෙත නිර්දේශ ඉදිරිපත් කිරීම නීත්‍යනුකූල වන්නේ ය.

මැතිවරණ කොමසාරිස් ජනරාල්වරයා සහ කොමිෂන් සභාවේ වෙනත් නිලධරයන්.

104ඈ. (1) මැතිවරණ කොමසාරිස් ජනරාල්වරයෙක් සිටිය යුත්තේ ය. ඒ මැතිවරණ කොමසාරිස් ජනරාල්වරයා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ අනුමතයට යටත්ව කොමිෂන් සභාව විසින් තීරණය කරනු ලැබිය යුතු නියමයන් සහ කොන්දේසි මත කොමිෂන් සභාව විසින් පත් කරනු ලැබිය යුත්තේ ය.

(2) තමා පිළිබඳ යම් කාරණයක් කොමිෂන් සභාව විසින් සලකා බලනු ලබන අවස්ථාවක දී හැර, කොමිෂන් සභාවේ රැස්වීම්වලට පැමිණ සිටීමේ හිමිකම මැතිවරණ කොමසාරිස් ජනරාල්වරයාට ඇත්තේ ය. එම රැස්වීම්වල දී ඡන්දය දීමේ අයිතිය ඔහුට නොමැත්තේ ය.

(3) කොමිෂන් සභාව විසින් තීරණය කරනු ලබන නියමයන් සහ කොන්දේසි මත කොමිෂන් සභාවට වෙනත් නිලධරයන් කොමිෂන් සභාව විසින් පත් කරනු ලැබිය හැක්කේ ය.

(4) මැතිවරණ කොමසාරිස් ජනරාල්වරයාගේ සහ කොමිෂන් සභාවේ වෙනත් නිලධරයන්ගේ වැටුප් කොමිෂන් සභාව විසින් තීරණය කරනු ලැබිය යුතු අතර, එම වැටුප් ඒකාබද්ධ අරමුදලට වැයබරක් විය යුත්තේ ය.

(5) මැතිවරණ කොමසාරිස් ජනරාල්වරයා විසින් කොමිෂන් සභාවේ තීරණ, කොමිෂන් සභාවේ විධානවලට සහ පාලනයට යටත්ව ක්‍රියාත්මක කරනු ලැබිය යුතු අතර, කොමිෂන් සභාවේ නිලධරයන් විෂයයෙහි අධීක්ෂණය කිරීම ද කරනු ලැබිය යුත්තේ ය.

(6) කොමිෂන් සභාවේ බලතල, කාර්ය සහ කර්තව්‍ය කිසිවක් කොමිෂන් සභාව විසින් මැතිවරණ කොමසාරිස් ජනරාල්වරයා වෙත හෝ කොමිෂන් සභාවේ වෙනත් යම් නිලධරයකු වෙත හෝ පවරා දෙනු ලැබිය හැකි අතර, කොමිෂන් සභාවේ විධානයට සහ පාලනයට යටත්ව මැතිවරණ කොමසාරිස් ජනරාල්වරයා හෝ ඒ වෙනත් නිලධරයා හෝ විසින් ඒ බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම ද ඉටු කිරීම ද කරනු ලැබිය යුත්තේ ය.

(7) මැතිවරණ කොමසාරිස් ජනරාල්වරයාගේ ධුරය–

(අ) ඔහු මිය ගිය විට ;

(ආ) කොමිෂන් සභාව අමතා යවනු ලබන ලියවිල්ලක් මගින් ඔහු ධුරයෙන් ඉල්ලා අස් වූ විට ;

(ඇ) ඔහු වයස අවුරුදු හැටපහ සම්පූර්ණ කළ විට ;

(ඈ) රෝගී භාවය හෝ ශාරීරික නැතහොත් මානසික දුර්වලතාව හේතු කොටගෙන කොමිෂන් සභාව විසින් ඔහු ධුරයෙන් ඉවත් කරනු ලැබූ විට ; හෝ

(ඉ) ඔප්පු කරනු ලැබූ විෂම පැවැත්ම හෝ අබලතාව හේතු කොට ගෙන ඔහු ඉවත් කිරීම සඳහා සංදේශයක් (8) වන ඡේදයේ විධිවිධානවලට අනුකූලව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබ කොමිෂන් සභාව විසින් ඔහු ධුරයෙන් ඉවත් කරනු ලැබූ විට,

හිස් වන්නේ ය.

(8) (අ) මේ ව්‍යවස්ථාවේ 7 වන ඡේදයේ (ඉ) අනුඡේදයේ සඳහන් සංදේශයට පක්ෂව, (නොපැමිණි මන්ත්‍රීවරයන් ද ඇතුළුව) පාර්ලිමේන්තුවේ මුළු මන්ත්‍රීවරයන් සංඛ්‍යාවේ බහුතරය විසින් ඡන්දය දීම අවශ්‍ය වන අතර, එවැනි යෝජනාවක් පිළිබඳ දැන්වීම පාර්ලිමේන්තුවේ මුළු මන්ත්‍රීවරයන් සංඛ්‍යාවෙන් තුනෙන් එකකට නොඅඩු මන්ත්‍රීවරයන් සංඛ්‍යාවක් විසින් අත්සන් කර ඇත්නම් සහ චෝදිත විෂම පැවැත්ම හෝ අබලතාව පිළිබඳ සම්පූර්ණ විස්තර එහි දක්වා ඇත්නම් මිස, එවැනි සංදේශයක් ඉදිරිපත් කිරීම සඳහා වූ කිසිම යෝජනාවක් කථානායකවරයා විසින් භාර ගැනීම හෝ පාර්ලිමේන්තුවේ න්‍යාය පත්‍රයට ඇතුළත් කිරීම හෝ නොකළ යුත්තේ ය.

(ආ) එවැනි යෝජනාවක් සම්මත කිරීමේ කාර්ය පටිපාටිය ද චෝදිත විෂම පැවැත්ම හෝ අබලතාව විමර්ශනය කිරීම සහ ඔප්පු කිරීම ද පෞද්ගලිකවම හෝ නියෝජිතයන් මගින් හෝ පෙනී සිටීමට සහ කරුණු දක්වා සිටීමට මැතිවරණ කොමසාරිස් ජනරාල්වරයා සතු අයිතිය ද ඇතුළුව, එවැනි සංදේශයක් ඉදිරිපත් කිරීමට අදාළ සියලු කාරණ සඳහා පාර්ලිමේන්තුව විසින් නීතියෙන් හෝ ස්ථාවර නියෝග මගින් හෝ විධිවිධාන සැලැස්විය යුත්තේ ය.

තේරීම් භාර නිලධරයන්.

104ඊ. (1) කොමිෂන් සභාව විසින්, ගැසට් පත්‍රයේ පළ කරනු ලබන දැන්වීමක් මගින්, එක් එක් මැතිවරණ දිස්ත්‍රික්කය සඳහා තේරීම් භාර නිලධරයකු වශයෙන් තැනැත්තකු නමින් හෝ නිලයෙන් හෝ කලින් කල පත් කරනු ලැබිය යුතු අතර, තේරීම් භාර නිලධරයාගේ කාර්යය ඉටු කිරීමේ දී ඔහුට සහාය වීම පිණිස තැනැත්තන් එක්කෙනකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් නමින් හෝ නිලයෙන් හෝ පත් කරනු ලැබිය හැක්කේ ය.

(2) (1) වන ඡේදය යටතේ පත් කරනු ලැබූ සෑම නිලධරයකු ම වෙත පවරන ලද කාර්ය සහ කර්තව්‍ය ඉටු කිරීමේ දී, කොමිෂන් සභාව විසින් නිකුත් කරනු ලබන විධානවලට ඔහු යටත් විය යුතු අතර, ඒ සම්බන්ධයෙන් කොමිෂන් සභාවට වග කිව යුතු සහ උත්තර දිය යුතු වන්නේ ය.

රජයේ නිලධරයන්.

104උ. යම් ඡන්ද විමසීමක දී හෝ ජනමත විචාරණයක දී කාර්ය සහ කර්තව්‍ය ඉටු කරන සියලුම රජයේ නිලධරයන් විසින්, ඒ කාර්ය සහ කර්තව්‍ය ඉටු කිරීමේ දී කොමිෂන් සභාව විසින් නිකුත් කරනු ලබන විධානවලට යටත්ව ක්‍රියා කළ යුතු අතර, ඒ සම්බන්ධයෙන් කොමිෂන් සභාවට වග කිව යුතු සහ උත්තර දිය යුතු වන්නේ ය.

රිට් ආඥා නිකුත් කිරීමට ශ්‍රේෂ්ඨාධිකරණය සතු බලය.

104ඌ. (1) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 140 වන ව්‍යවස්ථාව යටතේ අභියාචනාධිකරණය වෙත පවරා ඇති අධිකරණ බලය, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් හෝ වෙනත් යම් නීතියක් මගින් හෝ

කොමිෂන් සභාව වෙත පවරා ඇති බලතල කොමිෂන් සභාව විසින් ක්‍රියාත්මක කරනු ලැබීමේ දී උද්ගත වන යම් කාරණයකට අදාළව, ශ්‍රේෂ්ඨාධිකරණය විසින් ක්‍රියාත්මක කරනු ලැබිය යුත්තේ ය.

(2) (1) වන ඡේදයේ සඳහන් අධිකරණ බලය අයැද ඉදිරිපත් කරනු ලබන සෑම ඉල්ලීමක් ම, එසේ ඉල්ලීමට අදාළ ක්‍රියාව සිදු කරන ලද දින සිට එක් මාසයක් ඇතුළත දී ඉදිරිපත් කරනු ලැබිය යුත්තේ ය. එවැනි ඉල්ලීමක් ඉදිරිපත් කරනු ලැබූ දින සිට මාස දෙකක් ඇතුළත දී ශ්‍රේෂ්ඨාධිකරණය විසින් ඒ ඉල්ලීම විමසා අවසාන වශයෙන් සුදුස්සක් කරනු ලැබිය යුත්තේ ය.

අර්ථ නිරූපණය.

104ඡ. මේ පරිච්ඡේදයේ "ඡන්ද විමසීමක් පැවැත්වෙන කාලසීමාව" යන්නෙන්, අවස්ථාවෝචිත පරිදි ජනමත විචාරණයක් හෝ ඡන්ද විමසීමක් හෝ පැවැත්වීම සඳහා ප්‍රකාශනයක් හෝ නියමයක් හෝ කරනු ලැබූ දිනයෙන් ආරම්භව, අවස්ථාවෝචිත පරිදි, ඒ ජනමත විචාරණයේ හෝ ඡන්ද විමසීමේ ඡන්ද ප්‍රතිඵලය ප්‍රකාශයට පත් කරනු ලබන දිනයෙන් අවසන් වන කාලසීමාව අදහස් වන්නේ ය.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 107 වන ව්‍යවස්ථාව සංශෝධනය කිරීම.

**10.** ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 107 වන ව්‍යවස්ථාවේ (1) වන ඡේදයේ දැක්වෙන, "ජනරජයේ ජනාධිපතිවරයා විසින් ස්වකීය අත්සන යටතේ වූ අධිකාර පත්‍රයක් මගින් පත් කරනු ලබන්නා හ." යන වචන වෙනුවට, "41ඇ ව්‍යවස්ථාවේ විධිවිධානවලට යටත්ව ජනාධිපතිවරයා විසින් ස්වකීය අත්සන යටතේ වූ අධිකාර පත්‍රයක් මගින් පත් කරනු ලබන්නා හ." යන වචන ආදේශ කිරීමෙන් ඒ ව්‍යවස්ථාව මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 109 වන ව්‍යවස්ථාව සංශෝධනය කිරීම.

**11.** ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 109 වන ව්‍යවස්ථාව පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :-

(1) ඒ ව්‍යවස්ථාවේ (1) වන ඡේදයේ දැක්වෙන "ජනාධිපතිවරයා විසින්" යන වචන වෙනුවට "ජනාධිපතිවරයා විසින්, 41ඇ ව්‍යවස්ථාවේ විධිවිධානවලට යටත්ව" යන වචන ආදේශ කිරීමෙන්,

(2) ඒ ව්‍යවස්ථාවේ (2) ඡේදයේ දැක්වෙන "ජනාධිපතිවරයා විසින් පත් කරනු ලැබිය හැක්කේ ය" යන වචන වෙනුවට, "ජනාධිපතිවරයා විසින් 41ඇ ව්‍යවස්ථාවේ විධිවිධානවලට යටත්ව පත් කරනු ලැබිය හැක්කේ ය." යන වචන ආදේශ කිරීමෙන්.

**12.** ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 111 වන ව්‍යවස්ථාව පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :- ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 111 වන ව්‍යවස්ථාව සංශෝධනය කිරීම.

(1) ඒ ව්‍යවස්ථාවේ (2) වන ඡේදය ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන ඡේදය ආදේශ කිරීමෙන් :-

"(2) මහාධිකරණයේ විනිශ්චයකාරවරයන්,-

(අ) අධිකරණ සේවා කොමිෂන් සභාවේ නිර්දේශය මත, ජනාධිපතිවරයා විසින් සිය අත්සන යටතේ වූ අධිකාර පත්‍රයක් මගින් පත් කරනු ලැබිය යුතු අතර, නීතිපතිවරයා විමසීමෙන් පසු ඒ නිර්දේශය කරනු ලැබිය යුත්තේ ය ;

(ආ) අධිකරණ සේවා කොමිෂන් සභාවේ නිර්දේශය මත, ජනාධිපතිවරයා විසින් ධුරයෙන් ඉවත් කරනු ලැබිය හැකි අතර ජනාධිපතිවරයාගේ විනය පාලනයට ඔවුහු යටත් විය යුත්තාහ." ; තවද

(2) ඒ ව්‍යවස්ථාවේ (3) වන ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් ඡේදය ඇතුළත් කිරීමෙන් :-

"(4) මහාධිකරණයේ කවර වුවද විනිශ්චයකාරවරයකු විසින්, ජනාධිපතිවරයා වෙත යොමු කරනු ලබන තම අත්සන යටතේ වූ ලියවිල්ලක් මගින්, ස්වකීය ධුරයෙන් ඉල්ලා අස්විය හැක්කේ ය.".

**13.** ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 111අ ව්‍යවස්ථාවේ (1) වන ඡේදයේ දැක්වෙන, "ජනාධිපතිවරයා විසින්, පත් කිරීමේ අධිකාර පත්‍රයක් මගින්" යන වචන වෙනුවට, "ජනාධිපතිවරයා විසින්, අධිකරණ සේවා කොමිෂන් සභාවේ නිර්දේශය මත, පත් කිරීමේ අධිකාර පත්‍රයක් මගින්" යන වචන ආදේශ කිරීමෙන් ඒ ව්‍යවස්ථාව මෙයින් සංශෝධනය කරනු ලැබේ. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 111අ ව්‍යවස්ථාව සංශෝධනය කිරීම.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 111ආ ව්‍යවස්ථාව ඇතුළත් කිරීම.

**14.** ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 111ඈ ව්‍යවස්ථාවට ඉක්බිතිව ම පහත දැක්වෙන ව්‍යවස්ථාව මෙයින් ඇතුළත් කරනු ලබන අතර එය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 111ආ ව්‍යවස්ථාව ලෙස බලපැවැත්විය යුත්තේ ය:–

"මුලු දිවයිනම සඳහා පිස්කල්වරයා.

111ආ. පිස්කල්වරයෙක් සිටිය යුත්තේ ය. ඔහු මුලු දිවයිනම සඳහා පිස්කල්වරයා විය යුතු අතර සියලුම මුල් අවස්ථා අධිකරණවලට අනුයුක්ත කොට ඇති නියෝජ්‍ය පිස්කල්වරයන් විෂයයෙහි අධීක්ෂණය සහ පාලනය ඔහු විසින් ක්‍රියාත්මක කරනු ලැබිය යුත්තේ ය.".

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 116 වන ව්‍යවස්ථාව 111ඈ ව්‍යවස්ථාව ලෙස නැවත අංක කිරීම.

**15.** ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 116 වන ව්‍යවස්ථාව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 111ඈ ව්‍යවස්ථාව ලෙස මෙයින් නැවත අංක කරනු ලැබේ.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ XVඅ පරිච්ඡේදය ඇතුළත් කිරීම.

**16.** ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 111ඈ ව්‍යවස්ථාවට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් පරිච්ඡේදය ඇතුළත් කරනු ලබන අතර එය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ XVඅ පරිච්ඡේදය ලෙස බලපැවැත්විය යුත්තේ ය.

"XVඅ පරිච්ඡේදය

**අධිකරණ සේවා කොමිෂන් සභාව**

අධිකරණ සේවා කොමිෂන් සභාවේ සංයුතිය.

111ඇ. (1) (මේ පරිච්ඡේදයෙහි "කොමිෂන් සභාව" යනුවෙන් සඳහන් කරනු ලබන) අධිකරණ සේවා කොමිෂන් සභාවක් වන්නේ ය. කොමිෂන් සභාව අග්‍ර විනිශ්චයකාරවරයාගෙන් සහ 41 ඇ ව්‍යවස්ථාවේ විධිවිධානවලට යටත්ව ජනාධිපතිවරයා විසින් පත් කරනු ලබන ශ්‍රේෂ්ඨාධිකරණයේ වෙනත් විනිශ්චයකාරවරයන් දෙදෙනකුගෙන් සමන්විත විය යුත්තේ ය.

(2) අග්‍ර විනිශ්චයකාරවරයා කොමිෂන් සභාවේ සභාපතිවරයා විය යුත්තේ ය.

කොමිෂන් සභාවේ රැස්වීම්.

111ඉ. (1) කොමිෂන් සභාවේ යම් රැස්වීමක් සඳහා ගණපූරණය කොමිෂන් සභාවේ සාමාජිකයන් දෙදෙනකුගෙන් සමන්විත විය යුත්තේ ය.

(2) කොමිෂන් සභාවේ සාමාජිකයකු ලෙස පත් කරනු ලැබූ ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිශ්චයකාරවරයකු, ස්වකීය ධුරයෙන් ඉල්ලා අස්වුවහොත් හෝ, මෙහි මින් මතු විධිවිධාන සලස්වා ඇති පරිදි ධුරයෙන් ඉවත් කරනු ලැබුවහොත් හෝ ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිශ්චයකාරවරයකුව සිටීම නතර වුවහොත් හෝ මිස, ඔහු පත් කරනු ලැබූ දින සිට අවුරුදු තුනක කාලයක් එම ධුරය දැරිය යුතු නමුත් නැවත පත් කරනු ලැබීමට ඔහු සුදුස්සෙක් වන්නේ ය.

(3) කොමිෂන් සභාවේ සියලු තීරණ, රැස්වීමට පැමිණ සිටින සාමාජිකයන්ගේ බහුතර ඡන්දයෙන් විය යුතු අතර යම් හෙයකින් ඡන්ද සංඛ්‍යාව සම සමව තිබෙන අවස්ථාවක ඒ රැස්වීමේ සභාපතිවරයාට තීරණ ඡන්දයක් තිබිය යුත්තේ ය.

(4) කොමිෂන් සභාවේ සාමාජික ධුරයක් හිස් ව තිබුණ ද කොමිෂන් සභාවට ක්‍රියා කිරීමට බලය ඇත්තේ ය. තවද එවැනි එසේ ධුරය හිස්ව තිබූ පමණින් ම හෝ සාමාජිකයකු පත්කිරීමෙහි ලා යම් දෝෂයක් තිබූ පමණින් කොමිෂන් සභාවේ යම් ක්‍රියාවක් නැතහොත් කටයුත්තක් නිර්බල නොවන්නේ ය ; නිර්බල වන්නේ යයි නොසැලකිය යුත්තේ ය.

(5) ජනාධිපතිවරයා විසින් කොමිෂන් සභාවේ යම් සාමාජිකයකුට, ඔහුගේ කාර්යයන්ගෙන් නිවාඩු දෙනු ලැබිය හැකි අතර, එසේ නිවාඩු දෙන ලද කාලසීමාව සඳහා කොමිෂන් සභාවේ තාවකාලික සාමාජිකයකු වීමට, ව්‍යවස්ථා සභාවේ නිර්දේශය මත, කොමිෂන් සභාවේ සාමාජිකත්වය ලැබීම සඳහා සුදුසුකම් ඇති තැනැත්තකු, ජනාධිපතිවරයා විසින් පත් කරනු ලැබිය හැක්කේ ය.

(6) ජනාධිපතිවරයා විසින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ නිර්දේශය මත කොමිෂන් සභාවේ කවර වූ හෝ සාමාජිකයකු හේතු දක්වා ධූරයෙන් ඉවත් කරනු ලැබිය හැක්කේ ය.

කොමිෂන් සභාවේ සාමාජිකයන්ගේ දීමනා.

111ඊ. පාර්ලිමේන්තුව විසින් නිශ්චය කරනු ලබන යම් දීමනාවක් කොමිෂන් සභාවේ සාමාජිකයකුට ගෙවනු ලැබිය යුත්තේ ය. ඒ දීමනාව ඒකාබද්ධ අරමුදලට වැයබරක් වන අතර සාමාජිකයාගේ ධූර කාලය තුළ දී අඩු නොකළ යුත්තේ ය. තව ද එම දීමනාව ඒ සාමාජිකයාගේ ස්ථිර තනතුරට අයත් වූ හා ඒ තනතුරෙන් ලබන්නා වූ වැටුපට සහ වෙනත් දීමනාවලට අමතරව විය යුත්තේ ය :

එසේ වුව ද දීමනා වශයෙන් ගෙවිය යුතු මුදල් ප්‍රමාණය මේ ව්‍යවස්ථාවේ විධිවිධාන යටතේ නිශ්චය කරනු ලබන තෙක් මේ පනත ක්‍රියාත්මක වන දිනයට පෙරාතුව ම වූ දිනයේ දී කොමිෂන් සභාවේ සාමාජිකයන් විසින් ලබන ලද මුදල් ප්‍රමාණය ඔවුන්ට දීමනා වශයෙන් තවදුරටත් ලැබිය යුත්තේ ය.

කොමිෂන් සභාවේ ලේකම්වරයා.

111උ. කොමිෂන් සභාවට මූල් අවස්ථා අධිකරණවල ජ්‍යෙෂ්ඨ අධිකරණ නිලධරයන් අතුරෙන් කොමිෂන් සභාව විසින් පත් කරනු ලැබිය යුතු ලේකම්වරයෙක් සිටිය යුත්තේ ය.

කොමිෂන් සභාවේ බලතල.

111ඌ. (1) අධිකරණ සේවා කොමිෂන් සභාවට –

(අ) මහාධිකරණ විනිශ්චයකාරවරයන්ගේ ස්ථාන මාරු කිරීමේ බලය ;

(ආ) අධිකරණ නිලධරයන් සහ උපලේඛනගත රජයේ නිලධරයන් පත් කිරීමේ, උසස් කිරීමේ, ස්ථාන මාරු කිරීමේ, සේවයෙන් පහ කිරීමේ හා ඔවුන් විෂයෙහි විනය පාලනය ක්‍රියාවේ යෙදීමේ බලය

මෙයින් පැවරෙන්නේ ය.

(2) කොමිෂන් සභාව විසින්-

(අ) මහාධිකරණයේ විනිශ්චයකාරවරයන් පුහුණු කිරීම සම්බන්ධයෙන් රීති සහ අධිකරණ නිලධරයන් සහ උපලේඛනගත රජයේ නිලධරයන් බඳවා ගැනීම, පුහුණු කිරීම, පත් කිරීම, උසස් කිරීම සහ ස්ථාන මාරු කිරීම සම්බන්ධයෙන් පටිපාටි සාදනු ලැබිය හැක්කේ ය ;

(ආ) කොමිෂන් සභාවේ බලතල, කාර්ය හා කර්තව්‍ය ක්‍රියාවේ යෙදීම හා ඉටු කිරීම සඳහා අවශ්‍ය හෝ අවස්ථාවෝචිත කාරණ සඳහා විධිවිධාන සලස්වනු ලැබිය හැක්කේ ය.

(3) යම් මූල් අවස්ථා අධිකරණයක් හෝ මූල් අවස්ථා අධිකරණයක පවත්වා ගෙන යනු ලබන වාර්තා, රෙජිස්ටර හෝ වෙනත් ලේඛන පරීක්ෂා කිරීමේ සහ අවශ්‍ය වන යම් පරීක්ෂණයක් පැවැත්වීමේ බලය සහ අධිකාරය, අවස්ථාවෝචිත පරිදි කොමිෂන් සභාවේ සභාපතිවරයාට හෝ කොමිෂන් සභාව විසින් බලය දෙනු ලැබූ, ශ්‍රේෂ්ඨාධිකරණයේ යම් විනිශ්චයකාරවරයකුට හෝ අභියාචනාධිකරණයේ යම් විනිශ්චයකාරවරයකුට හෝ තිබිය යුත්තේ ය.

(4) උපලේඛනගත රජයේ නිලධරයන් සම්බන්ධයෙන් වැටුප් වැඩිවීමක් සහිත මාරුවීමක් නොවන සියලු මාරුවීම් කිරීමේ බලය හෝ නියමයේ නිශ්චිතව සඳහන් අවස්ථාවන්හි දී සහ සීමා කිරීම්වලට යටත්ව, වැඩ බැලීමේ, පත්වීම් කිරීමේ බලය කොමිෂන් සභාව විසින් ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයකින් කොමිෂන් සභාවේ ලේකම්වරයාට පවරනු ලැබිය හැක්කේ ය.

අධිකරණ නිලධරයකුට හෝ උපලේඛනගත රජයේ නිලධරයකුට ඉල්ලා අස්විය හැකි බව.

111එ. යම් අධිකරණ නිලධරයකුට හෝ උපලේඛනගත රජයේ නිලධරයකුට කොමිෂන් සභාවේ සභාපතිවරයා අමතා ස්වකීය අත්සනින් යවනු ලබන ලිපියක් මගින් ධුරයෙන් ඉල්ලා අස්විය හැක්කේ ය.

නඩු කටයුතුවලින් මුක්ත බව.

111ඒ. කොමිෂන් සභාවේ සභාපතිවරයා විසින් හෝ කොමිෂන් සභාවේ සාමාජිකයකු හෝ ලේකම්වරයා හෝ නිලධරයකු විසින් ඒ සභාපතිවරයා, සාමාජිකයා, ලේකම්වරයා හෝ කොමිෂන් සභාවේ නිලධරයා වශයෙන් ස්වකීය කාර්ය හෝ කර්තව්‍ය ඉටු කිරීමෙහි ලා සද්භාවයෙන් කරන ලද යම් නීත්‍යනුකූල ක්‍රියාවක් හේතුකොට ගෙන ඔහුට විරුද්ධව කිසිදු සිවිල් නඩුවක් හෝ නඩු කටයුත්තක් පවරනු නොලැබිය යුත්තේ ය.

කොමිෂන් සභාවේ කටයුතුවලට අයුතු ලෙස මැදිහත් වීම වරදක් බව.

111ඔ. (1) ස්වකීය නීත්‍යනුකූල කාර්ය ඉටු කිරීමේලා හැර කෙළින්ම හෝ අන්‍යාකාරයකින් තමන් විසින් ම හෝ වෙනත් තැනැත්තකු මාර්ගයෙන් හෝ වෙනත් තැනැත්තකු සමග, කවර හෝ ආකාරයකින් කොමිෂන් සභාව විසින් දෙනු ලබන තීරණයකට හෝ නියමයකට බලපෑමක් කරන හෝ බලපෑමක් කිරීමට තැත් කරන හෝ කොමිෂන් සභාවේ සාමාජිකයකුට ඒ ආකාරයෙන් බලපෑමක් කරන සෑම තැනැත්තෙක් ම වරදක් කරන අතර, වරදකරු කරනු ලැබූ විට රුපියල් එක් ලක්ෂයක් නොඉක්මවන දඩයකට හෝ අවුරුදු තුනක් නොඉක්මවන කාලයක් සඳහා බන්ධනාගාරගත කරනු ලැබීමට හෝ ඒ දඩය හා බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකටම හෝ ඒ තැනැත්තා යටත් වන්නේ ය :

එසේ වුවද යම් අධිකරණ ධුරයක් හෝ උපලේඛනගත රජයේ තනතුරක් ඉල්ලුම් කරන ඉල්ලුම්කරුවකුට හෝ අපේක්ෂකයකුට සහතිකයක් හෝ චරිත සහතිකයක් දීම වරදක් නොවන්නේ ය.

(2) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154ග ව්‍යවස්ථාව යටතේ පිහිටුවන ලද සෑම මහාධිකරණයකට ම මේ ව්‍යවස්ථාවේ (1) වන ඡේදයේ සඳහන් කවර හෝ කාරණයක් විභාග කොට තීරණය කිරීමට අධිකරණ බලය ඇත්තේ ය.

අර්ථ නිරූපණය.

111ඕ. (අ) මේ පරිච්ඡේදයෙහි -

"පත් කිරීම" යන්නට මේ පරිච්ඡේදයෙහි සඳහන් කවර හෝ ධුරයක වැඩ බැලීම සඳහා වූ පත් කිරීමක් ඇතුළත් වේ ;

"අධිකරණ නිලධරයා" යන්නෙන් යුක්තිය පසිඳලීම සඳහා හෝ යම් කම්කරු හෝ වෙනත් ආරාවුලක් විනිශ්චය කිරීම සඳහා හෝ ඇති කොට පිහිටුවන ලද යම් මුල් අවස්ථා අධිකරණයක, විනිශ්චය අධිකාරයක හෝ ආයතනයක විනිශ්චයකාරවරයා, මූලාසන දරන නිලධරයා හෝ සාමාජිකයකු ලෙස ධුරය දරන යම් තැනැත්තෙක් අදහස් වන නමුත් ඊට ශ්‍රේෂ්ඨාධිකරණ විනිශ්චයකාරවරයකු හෝ අභියාචනාධිකරණ විනිශ්චයකාරවරයකු හෝ මහාධිකරණ විනිශ්චයකාරවරයකු හෝ බේරුම් කිරීමේ කර්තව්‍ය ඉටු කරන තැනැත්තකු හෝ තමාගේ ප්‍රධාන කාර්යය අධිකරණ ස්වභාවයක කාර්ය ඉටු කිරීම නොවන රජයේ නිලධරයකු හෝ ඇතුළත් නොවේ ; සහ

"උපලේඛනගත රජයේ නිලධරයා" යන්නෙන් ශ්‍රේෂ්ඨාධිකරණයේ රෙජිස්ට්‍රාර්වරයා, අභියාචනාධිකරණයේ රෙජිස්ට්‍රාර්වරයා, මහාධිකරණයේ හෝ යම් මුල් අවස්ථා අධිකරණයක රෙජිස්ට්‍රාර්වරයා, නියෝජ්‍ය රෙජිස්ට්‍රාර්වරයා හෝ සහකාර රෙජිස්ට්‍රාර්වරයා, අභියාචනාධිකරණයේ හෝ මහාධිකරණයේ යහ කවර හෝ

මුල් අවස්ථා අධිකරණයක පිස්කල්වරයා හෝ නියෝජ්‍ය පිස්කල්වරයා ; හෝ ශ්‍රේෂ්ඨාධිකරණයේ, අභියාචනාධිකරණයේ, මහාධිකරණයේ හෝ කවර හෝ මුල් අවස්ථා අධිකරණයක රෙජිස්ට්‍රාර් කාර්යාලයේ සේවයෙහි නියුක්ත කර ඇත්තා වූ සහ පස්වන උපලේඛනයේ නිශ්චය කොට දැක්වෙන ගණයකට අයත් හෝ අමාත්‍ය මණ්ඩලයේ අධිකරණ විෂයය භාර අමාත්‍යවරයා විසින් නියමයක් මගින් නිශ්චිතව නියම කරනු ලැබ පාර්ලිමේන්තුව විසින් අනුමත කරන ලදුව ගැසට් පත්‍රයේ පළ කරන ලද වෙනත් යම් ගණයකට අයත් යම් රජයේ නිලධරයෙක් අදහස් වේ.

(ආ) යම් තැනැත්තෙක් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ අර්ථානුකූලව අධිකරණ නිලධරයකු වන්නේ ද නොවන්නේ ද යන ප්‍රශ්නය නිරාකරණය කිරීම සඳහා භාර ගැනීමට හෝ ඒ ප්‍රශ්නය තීරණය කිරීමට කිසිදු අධිකරණයකට, විනිශ්චයාධිකාරයකට හෝ ආයතනයකට අධිකරණ බලය නොමැති නමුත් ඒ ප්‍රශ්නය කොමිෂන් සභාව විසින් ම අනන්‍යව තීරණය කරනු ලැබිය යුත්තේ ය. ඒ පිළිබඳව කොමිෂන් සභාවේ තීරණය අවසානාත්මක හා තීරණාත්මක වන්නේ ය.

(ඇ) (ආ) අනුච්ඡේදයේ සඳහන් පරිදි වූ යම් තීරණයකට පෙරාතුව ඒ තැනැත්තා විසින් කරන ලද යම් ක්‍රියාවක් හෝ ඒ තැනැත්තා ඉදිරියේ පවරන ලද යම් නඩු කටයුත්තක් ඒ තීරණය කිරීමේ හේතුවෙන් නිර්බල වන්නේ යයි සලකනු නොලැබිය යුත්තේ ය.".

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 112, 113, 113අ, 114, 115 සහ 117 වන ව්‍යවස්ථා පරිච්ඡින්න කිරීම.

**17.** ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 112, 113, 113අ, 114, 115 සහ 117 වන ව්‍යවස්ථා මෙයින් පරිච්ඡින්න කරනු ලැබේ.

**18.** ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 153 වන ව්‍යවස්ථාව පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :-

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 153 වන වගන්තිය සංශෝධනය කිරීම.

(1) ඒ ව්‍යවස්ථාවේ (1) වන ඡේදයෙහි " ජනාධිපතිවරයා විසින් පත් කරනු ලබන්නේ ය " යන වචන වෙනුවට "41ඇ ව්‍යවස්ථාවේ විධිවිධානවලට යටත්ව ජනාධිපතිවරයා විසින් පත් කරනු ලබන්නේ ය." යන වචන ආදේශ කිරීමෙන් ; සහ

(2) ඒ ව්‍යවස්ථාවේ (4) වන ඡේදයෙහි " ජනාධිපතිවරයාට බලය ඇත්තේ ය." යන වචන වෙනුවට "41ඇ ව්‍යවස්ථාවේ විධිවිධානයන්ට යටත්ව ජනාධිපතිවරයාට බලය ඇත්තේ ය. ", යන වචන ආදේශ කිරීමෙන්.

**19.** ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154ග ව්‍යවස්ථාව, එහි (1) වන ඡේදයේ (ඇ) අනුඡේදයේ " නියෝජනය කිරීම සඳහා වෙනත් සාමාජිකයන් තිදෙනෙක් " යන වචන වෙනුවට " නියෝජනය කිරීම සඳහා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ නිර්දේශය මත ජනාධිපතිවරයා විසින් පත් කරනු ලබන වෙනත් සාමාජිකයන් තිදෙනෙක් " යන වචන ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154ග ව්‍යවස්ථාව සංශෝධනය කිරීම.

**20.** ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 155 ව්‍යවස්ථාවට ඉක්බිතිව ම මෙහි පහත දැක්වෙන අලුත් පරිච්ඡේදය ඇතුළත් කරනු ලබන අතර එය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ XVIIIඅ පරිච්ඡේදය ලෙස බලාත්මක විය යුත්තේ ය.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 155 ව්‍යවස්ථාවට ඉක්බිතිව ම XVIIIඅ අලුත් පරිච්ඡේදයක් ඇතුළත් කිරීම.

"XVIIIඅ පරිච්ඡේදය

**ජාතික පොලිස් කොමිෂන් සභාව**

ජාතික පොලිස් කොමිෂන් සභාවේ සංයුතිය.

155අ. (1) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ නිර්දේශය මත ජනාධිපතිවරයා විසින් පත් කරනු ලබන සාමාජිකයන් හත් දෙනකුගෙන් සමන්විත වන (මේ පරිච්ඡේදයේ "කොමිෂන් සභාව" යනුවෙන් සඳහන් කරනු ලබන) ජාතික පොලිස් කොමිෂන්

සභාවක් තිබිය යුත්තේ ය. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව විසින් ස්වකීය නිර්දේශ ඉදිරිපත් කිරීමේ දී, රාජ්‍ය සේවා කොමිෂන් සභාව විමසනු ලැබිය හැක්කේ ය. ජනාධිපතිවරයා විසින්, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ නිර්දේශය මත, එකී සාමාජිකයන්ගෙන් එක් සාමාජිකයකු කොමිෂන් සභාවේ සභාපතිවරයා ලෙස පත් කරනු ලැබිය යුත්තේ ය.

(2) යම් තැනැත්තකු පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු, පළාත් සභා මන්ත්‍රීවරයකු හෝ පළාත් පාලන ආයතනයක සභිකයකු නම් හෝ එවැන්නකු බවට පත් වුවහොත් හෝ එවැනි තැනැත්තකු කොමිෂන් සභාවේ සාමාජිකයකු ලෙස පත් කරනු නොලැබිය යුතු අතර සාමාජිකයකු වශයෙන් තවදුරටත් කටයුතු නොකළ යුත්තේ ය.

(3) කොමිෂන් සභාවේ සාමාජිකයකු ලෙස පත් කරනු ලැබීමට පෙරාතුව ම රජයේ නිලධරයකු හෝ අධිකරණ නිලධරයකු හෝ වශයෙන් රජයේ සේවයේ නියුක්තව සිටි සෑම තැනැත්තකු ම එකී පත් කිරීම බලාත්මක වූ විට, තමා දරමින් සිටි ධුරය අත්හැරිය යුතු අතර, රජයේ නිලධරයකු හෝ අධිකරණ නිලධරයකු හෝ වශයෙන් තවදුරටත් පත් කරනු ලැබීමට ඔහු සුදුස්සෙක් නොවිය යුත්තේය :

එසේ වුවද එවැනි යම් තැනැත්තකු කොමිෂන් සභාවේ සාමාජිකයකුව සිටීම නතර වන තෙක් හෝ, අවස්ථාවෝචිත පරිදි, ඔහු රජයේ නිලධරයකු හෝ අධිකරණ නිලධරයකු හෝ වශයෙන් සිටී නම් ඔහු විශ්‍රාම ගත යුතු වන්නා වූ වයසට, කොමිෂන් සභාවේ සාමාජිකයකුව සිටිය දී ඔහු එළඹුන හොත් හෝ, ඒ සේවයට අදාළ විශ්‍රාම වැටුප්, පාරිශ්‍රමික සහ වෙනත් දීමනා ගෙවීමට සම්බන්ධ යම් විධිවිධානයක කාර්ය සඳහා, ඔහු රජයේ නිලධරයකු හෝ අධිකරණ නිලධරයකු ලෙසත් රජයේ සේවයේ විශ්‍රාම වැටුප් සහිත ධුරයක් දරන ලෙසත් සලකනු ලැබිය යුත්තේ ය.

(4) කොමිෂන් සභාවේ සෑම සාමාජිකයකු ම, මේ ව්‍යවස්ථාවේ (2) වන ඡේදය යටතේ යම් නුසුදුසුකමකට පත්වුවහොත් හෝ ජනාධිපතිවරයා අමතා යවන ලිපියක් මගින් තම ධුරයෙන් කලින් ඉල්ලා අස්වුවහොත් හෝ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ නිර්දේශය මත ජනාධිපතිවරයා විසින් ධුරයෙන් ඉවත් කරනු ලැබුවහොත් හෝ චරිත දූෂණ වරදක් සම්බන්ධයෙන් අධිකරණයක් විසින් වරදකරු කරනු ලැබුවහොත් හෝ ඔහු විෂයයෙහි සිවිල් අශක්නුතා නියම කිරීමේ යෝජනා සම්මතයක් 81 වන ව්‍යවස්ථාවට අනුකූලව සම්මත කරනු ලැබ ඇත්නම් මිස හෝ, මේ ව්‍යවස්ථාවේ (6) වන ඡේදය යටතේ ඔහු සිය ධුරය හැර ගියාක් සේ සලකනු ලබන්නේ නම් හෝ මිස, එවැනි සාමාජිකයකු වශයෙන් ඔහු පත් කරනු ලැබූ දින සිට අවුරුදු තුනක කාලයක් ධුරය දැරිය යුත්තේ ය.

(5) කොමිෂන් සභාවේ සාමාජිකයකු ලෙස නැවත පත් කරනු ලැබීමට කොමිෂන් සභාවේ සාමාජිකයකු සුදුස්සකු විය යුතු අතර සාමාජිකයකු වශයෙන් ඔහුගේ ධුර කාලය අවසන් වීමෙන් පසු රජයේ නිලධරයකු වශයෙන් හෝ අධිකරණ නිලධරයකු වශයෙන් පත් කරනු ලැබීමට ඔහු සුදුස්සෙක් නොවිය යුත්තේ ය. වාර දෙකකට වඩා වැඩි වාර ගණනක් කොමිෂන් සභාවේ සාමාජිකයකු ලෙස ධුරය දැරීමට කිසිදු සාමාජිකයෙක් සුදුස්සකු නොවිය යුත්තේ ය.

(6) කොමිෂන් සභාවේ පූර්ව අනුමතය ලබා නොගෙන කොමිෂන් සභාවේ අනුක්‍රමික රැස්වීම් තුනකට කොමිෂන් සභාවේ සභාපතිවරයා හෝ සාමාජිකයකු හෝ නොපැමිණි අවස්ථාවක දී ඒ රැස්වීම් අතුරෙන් තුන්වන රැස්වීමේ දින සිට ඔහු සිය ධුරය හැර ගියාක් සේ සලකනු ලැබිය යුතු අතර, කොමිෂන් සභාවේ සභාපතිවරයා හෝ සාමාජිකයකු හෝ වශයෙන් නැවත පත් කරනු ලැබීමට ඔහු සුදුස්සෙක් නොවිය යුත්තේ ය.

(7) පාර්ලිමේන්තුව විසින් තීරණය කරනු ලබන දීමනා කොමිෂන් සභාවේ සභාපතිවරයාට සහ සාමාජිකයන්ට ගෙවිය යුත්තේ ය. එම දීමනා ඒකාබද්ධ අරමුදලට වැයබරක් විය යුතු අතර සභාපතිවරයාගේ හෝ සාමාජිකයන්ගේ ධුර කාලය තුළ දී ඒ දීමනා අඩු නොකළ යුත්තේ ය.

(8) දණ්ඩ නීති සංග්‍රහයේ IX වන පරිච්ඡේදයේ අර්ථානුකූලව සහ කාර්ය සඳහා කොමිෂන් සභාවේ සභාපතිවරයා සහ සාමාජිකයන් රජයේ සේවකයන් ලෙස සලකනු ලැබිය යුත්තේ ය.

කොමිෂන් සභාවේ රැස්වීම්.

155ආ. (1) කොමිෂන් සභාවේ යම් රැස්වීමක් සඳහා ගණපූරණය සාමාජිකයන් හතර දෙනකු විය යුත්තේ ය.

(2) කොමිෂන් සභාවේ සියලුම රැස්වීම්වල මූලසුන සභාපතිවරයා විසින් දැරිය යුත්තේ ය. ඔහු පැමිණ නොසිටි විටක දී ඒ රැස්වීමට පැමිණ සිටින සාමාජිකයන් විසින් තමන් අතුරෙන් කෙනකු ඒ රැස්වීමේ මූලසුන දැරීමට තෝරා පත් කර ගනු ලැබිය යුත්තේ ය.

(3) කොමිෂන් සභාවේ තීරණ, ඒ තීරණය ගනු ලබන රැස්වීමට පැමිණ ඡන්දය දෙන සාමාජිකයන්ගේ බහුතර ඡන්දයෙන් ගනු ලැබිය යුත්තේ ය. ඡන්දය සම සමව ලැබුණු අවස්ථාවක දී මූලසුන දරන තැනැත්තාට තීරණ ඡන්දයක් තිබිය යුත්තේ ය.

(4) කොමිෂන් සභාවේ සාමාජිකත්වයේ යම් පුරප්පාඩුවක් තිබුණේ වුවද ඒ නොතකා ක්‍රියා කිරීමේ බලය කොමිෂන් සභාවට ඇති අතර, එවැනි පුරප්පාඩුවක් තිබීම හෝ සභාපතිවරයා හෝ සාමාජිකයකු හෝ පත් කිරීමේ යම් දෝෂයක් තිබීම හේතුකොට ගෙන පමණක් කොමිෂන් සභාවේ යම් ක්‍රියාවක්, කාර්ය පටිපාටියක් හෝ තීරණයක් නිර්බල නොවන්නේ ය ; නිර්බල වන්නේ යයි නොසැලකිය යුත්තේ ය.

නීති කෘත්‍ය වලින් මුක්තිය.

155ඇ. කොමිෂන් සභාව වෙත, එහි යම් කමිටුවක් වෙත හෝ සාමාජිකයකු වෙත මේ පරිච්ඡේදය යටතේ හෝ වෙනත් යම් නීතියක් යටතේ හෝ පවරා දී ඇති හෝ පනවා ඇති බලතල හෝ කාර්ය කිසිවක් ප්‍රකාර, කොමිෂන් සභාව විසින්, එවැනි යම් කමිටුවක් විසින් හෝ කොමිෂන් සභාවේ නැතහොත් ඒ කමිටුවේ යම් සමාජිකයකු විසින් කරනු ලැබූ යම් නියමයක් හෝ ගනු ලැබූ යම් තීරණයක් පරීක්ෂා කිරීමට හෝ ඒ සම්බන්ධයෙන් ප්‍රකාශයක් කිරීමට හෝ කවර වූවද ආකාරයකින් ඒ ගැන ප්‍රශ්න කිරීමට, 126 වන ව්‍යවස්ථාවේ (1) වන ඡේදයෙන් ශ්‍රේෂ්ඨාධිකරණය වෙත පවරා දී ඇති අධිකරණ බලයට යටත්ව, කිසිදු අධිකරණයකට හෝ විනිශ්චයාධිකාරයකට බලය හෝ අධිකරණ බලය නොතිබිය යුත්තේ ය.

කොමිෂන් සභාවේ ලේකම්වරයා.

155ඈ. කොමිෂන් සභාව විසින් තීරණය කරනු ලබන නියමයන් හා කොන්දේසි මත කොමිෂන් සභාව විසින් පත් කරනු ලබන ලේකම්වරයකු සහ වෙනත් නිලධරයන් කොමිෂන් සභාව සඳහා සිටිය යුත්තේ ය.

පිරිවැය සහ වියදම්.

155ඉ. කොමිෂන් සභාවේ පිරිවැය සහ වියදම් ඒකාබද්ධ අරමුදලට වැයබරක් විය යුත්තේ ය.

කොමිෂන් සභාවේ කටයුතුවලට අයුතු ලෙස මැදිහත් වීම.

155ඊ. (1) තමන්ගේ නීත්‍යනුකූල කාර්ය ඉටු කිරීමේ දී හැර, කොමිෂන් සභාවේ හෝ එහි යම් කමිටුවක හෝ යම් තීරණයකට කෙළින් ම හෝ අන්‍යාකාරයකින් හෝ තමා විසින් ම හෝ වෙනත් යම් තැනැත්තකු මඟින් හෝ වෙනත් යම් තැනැත්තකු සමඟ එක් වී හෝ කවර වූවද ආකාරයකින් බලපෑම් කරන හෝ බලපෑම් කිරීමට උත්සාහ කරන හෝ අයුතු ලෙස මැදිහත් වන හෝ, කොමිෂන් සභාවේ හෝ එහි යම් කමිටුවක සාමාජිකයකු වෙත එසේ බලපෑමක් කරන හෝ කිරීමට තැත් කරන සෑම තැනැත්තකු ම වරදකට වරදකරු වන අතර ඔහු එසේ වරදකරු කරනු ලැබූ විට රුපියල් එක් ලක්ෂයක දඩයකට හෝ අවුරුදු හතක් නොඉක්මවන කාලයකට බන්ධනාගාරගත කරනු ලැබීමට හෝ ඒ දඩය සහ ඒ බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකට ම හෝ ඔහු යටත් විය යුත්තේ ය.

(2) (1) වන ඡේදයේ සඳහන් යම් කරුණක් අසා තීරණය කිරීමේ අධිකරණ බලය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154ග ව්‍යවස්ථාව යටතේ පිහිටුවන ලද මහාධිකරණයකට තිබිය යුත්තේ ය.

කොමිෂන් සභාවේ බලතල.

155ද. (1) (අ) පොලිස්පතිවරයා හැර, පොලිස් නිලධරයන් පත් කිරීමේ, උසස් කිරීමේ, මාරු කිරීමේ ඔවුන් විෂයයෙහි විනය පාලනය පවත්වාගෙන යාමේ සහ ඔවුන් සේවයෙන් පහ කිරීමේ බලය කොමිෂන් සභාව වෙත පැවරිය යුත්තේ ය. උසස් කිරීම්, මාරු කිරීම්, විනය පාලනය සහ සේවයෙන් පහ කිරීම් පිළිබඳ කොමිෂන් සභාවේ බලතල පොලිස්පතිවරයා විමසා කොමිෂන් සභාව විසින් ක්‍රියාත්මක කරනු ලැබිය යුත්තේ ය.

(ආ) මේ ව්‍යවස්ථාව යටතේ ස්වකීය බලතල ක්‍රියාත්මක කිරීමේ දී, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ XVIIඅ පරිච්ඡේදය යටතේ පළාත් පොලිස් කොමිෂන් සභා පිහිටුවනු ලබන පරිදි සහ පිහිටුවනු ලබන විට ඒ පළාත් පොලිස් කොමිෂන් සභාව වෙත පවරනු ලබන බලතල සහ කාර්ය හීන කිරීමක්, කොමිෂන් සභාව විසින් නොකළ යුත්තේ ය.

(2) මහජනයාගෙන් ලැබෙන පැමිණිලි සහ අතෘප්තියට පත් යම් තැනැත්තකු විසින් පොලිස් නිලධරයකුට හෝ පොලිස් සේවයට හෝ විරුද්ධව ඉදිරිපත් කරනු ලබන පැමිණිලි භාර ගැනීමේ සහ ඒවා විමර්ශනය කිරීමේ කාර්ය පටිපාටි කොමිෂන් සභාව විසින් පිහිටුවිය යුතු අතර, තත් කාර්යය සඳහා පාර්ලිමේන්තුව විසින් පනවන ලද යම් නීතියක විධිවිධානවලට අනුකූලව සහන සලස්වා දිය යුත්තේ ය.

(3) පොලිස් නිලධරයන් බඳවා ගැනීම සහ පුහුණු කිරීම පිළිබඳ පටිපාටි සකස් කිරීම, පොලිස් සේවයේ කාර්යක්ෂමතාව හා ස්වාධීනත්වය වැඩි දියුණු කිරීම, ජාතික අංශයේ සහ පළාත් අංශවල භාවිතය සඳහා අවශ්‍ය අවි ආයුධ, වෙඩිද්‍රව්‍ය සහ

වෙනත් උපකරණවල ස්වභාවය සහ වර්ගය, චර්යා සංග්‍රහ සහ උසස් කිරීමේ දී සහ ස්ථාන මාරු කිරීමේ දී අනුගමනය කළ යුතු ප්‍රමිති ඇතුළුව පොලිස් නිලධරයන් සම්බන්ධයෙන් වූ සියලුම කාරණ සඳහා සුදුසු යයි හෝ අවශ්‍ය යයි කොමිෂන් සභාව විසින් කලින් කල සලකනු ලබන පරිදි විධිවිධාන සැලැස්වීම සහ තීරණය කිරීම කොමිෂන් සභාව විසින් කරනු ලැබිය යුත්තේ ය.

(4) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ නවවන උපලේඛනයේ 1 වන ලැයිස්තුවේ 1 වන පරිශිෂ්ටය යටතේ කොමිෂන් සභාව වෙත පවරා ඇති සියලු ම බලතල ක්‍රියාත්මක කිරීම හා සියලු කාර්ය සහ කර්තව්‍ය ඉටු කිරීම කොමිෂන් සභාව විසින් කරනු ලැබිය යුත්තේ ය.

කොමිෂන් සභාවේ කමිටු.

155ඌ. (1) කොමිෂන් සභාව විසින් නියම කරනු ලබන ශ්‍රේණිවල පොලිස් නිලධරයන් පත් කිරීමේ, උසස් කිරීමේ, ස්ථාන මාරු කිරීමේ සහ ඔවුන් විෂයයෙහි විනය පාලනය කිරීමේ සහ ඔවුන් සේවයෙන් පහ කිරීමේ ලා කොමිෂන් සභාව සතු බලතල කොමිෂන් සභාව විසින් නම් කරනු ලැබිය යුතු (කොමිෂන් සභාවේ සාමාජිකයන්ගෙන් සමන්විත නොවන) කමිටුවක් වෙත, කොමිෂන් සභාව විසින් පවරනු ලැබිය හැක්කේ ය.

(2) එවැනි යම් කමිටුවක් පත් කිරීම කොමිෂන් සභාව විසින් ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුත්තේ ය.

(3) එවැනි කමිටුවක රැස්වීම්වල දී අනුගමනය කළ යුතු කාර්ය පටිපාටිය සහ ඒ රැස්වීම්වල ගණපූරණය, කොමිෂන් සභාව විසින් සාදනු ලබන රීති වලට අනුකූලව විය යුත්තේ ය. කොමිෂන් සභාව විසින් ඒ රීති ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුත්තේ ය.

කොමිෂන් සභාව විසින් කාර්ය පැවරීම.

155එ. (1) යම් ශ්‍රේණියක පොලිස් නිලධරයන් පත් කිරීම, ඔවුන් උසස් කිරීම, ස්ථාන මාරු කිරීම, ඔවුන් විෂයයෙහි විනය පාලනය කිරීම සහ සේවයෙන් පහ කිරීම සඳහා කොමිෂන් සභාව සතු බලතල, කොමිෂන් සභාව විසින් නියම කරනු ලබන කොන්දේසිවලට සහ කාර්ය පටිපාටියට යටත්ව, පොලිස්පතිවරයා වෙත හෝ පොලිස්පතිවරයා විමසා යම් පොලිස් නිලධරයකු වෙත කොමිෂන් සභාව විසින් පවරනු ලැබිය හැක්කේ ය.

(2) එවැනි යම් බලතල පැවරීමක්, කොමිෂන් සභාව විසින් ගැසට් පත්‍රයේ පළ කරවනු ලැබිය යුත්තේ ය.

අභියාචන කිරීමේ අයිතිය.

155ඒ. (1) යම් පොලිස් නිලධරයකුගේ උසස්වීමක් හෝ ස්ථාන මාරුවක් හෝ ඔහු සම්බන්ධ යම් විනය කාරණයක් හෝ ඔහු සේවයෙන් පහ කිරීමක් හෝ පිළිබඳව 155ඌ සහ 155එ ව්‍යවස්ථාවල සඳහන් කමිටුව හෝ පොලිස්පතිවරයා හෝ පොලිස් නිලධරයා හෝ විසින් කරනු ලැබූ නියමයකින් එකී පොලිස් නිලධරයා අතෘප්තියට පත් වේ නම් අභියාචනයක් ඉදිරිපත් කිරීමේ සහ අභියාචනයක් අසා තීරණය කිරීමේ කාර්ය පටිපාටිය හා නියමිත කාල පරිච්ඡේදය විධිමත් කරමින් කලින් කල කොමිෂන් සභාව විසින් සාදනු ලබන රීතිවලට අනුකූලව, ඒ පොලිස් නිලධරයා විසින් කොමිෂන් සභාව වෙත අභියාචනයක් ඉදිරිපත් කරනු ලැබිය හැක්කේ ය.

(2) එවැනි අභියාචනයක් ඉදිරිපත් කරනු ලැබූ විට සුදුසු යයි කොමිෂන් සභාව විසින් සලකනු ලබන පරිදි, ඒ නියම වෙනස් කිරීමේ, මද වශයෙන් වෙනස් කිරීමේ, ප්‍රත්‍යාදිෂ්ට කිරීමේ හෝ ස්ථිර කිරීමේ හෝ ඒ සම්බන්ධයෙන් විධාන නිකුත් කිරීමේ හෝ තවදුරටත් වූ හෝ වෙනත් හෝ පරීක්ෂණයක් පැවැත්වීමට නියම කිරීමේ බලය කොමිෂන් සභාවට ඇත්තේ ය.

(3) මේ ව්‍යවස්ථාවේ (1) වන ඡේදය යටතේ කොමිෂන් සභාව විසින් කලින් කල සාදනු ලබන රීති ගැසට් පත්‍රයේ පළ කරවනු ලැබිය යුත්තේ ය.

(4) අවස්ථාවෝචිත පරිදි මේ පරිච්ඡේදයේ 155උ෴ හෝ 155ඌ ව්‍යවස්ථා යටතේ කමිටුවක් වෙත හෝ පොලිස්පතිවරයා වෙත හෝ පොලිස් නිලධරයකු වෙත බලතල පවරා දෙනු ලැබූ විට කොමිෂන් සභාව විසින් එසේ පවරන ලද බලතල බලාත්මකව පවතිද්දී, ඒ බලතල පැවරීම කරන ලද්දේ යම් ශ්‍රේණියක පොලිස් නිලධරයන් සම්බන්ධයෙන් ද ඒ ශ්‍රේණියේ පොලිස් නිලධරයන් සම්බන්ධයෙන් මෙහි ඉහත විධිවිධාන සලස්වා ඇති පරිදි අභියාචනය කිරීමේ අයිතියට යටත්ව කොමිෂන් සභාව විසින් ඒ බලතල පාවිච්චි කිරීම හෝ ඒ කාර්ය හෝ කර්තව්‍ය ඉටු කිරීම නොකරනු ලැබිය යුත්තේ ය.

පරිපාලන අභියාචන විනිශ්චයාධිකාරය වෙත අභියාචන කිරීම.

155ඍ. තමන්ගේ උසස්වීමක් හෝ ස්ථාන මාරුවක් හෝ තමා සම්බන්ධයෙන් වූ විනය පිළිබඳ කාරණයක දී හෝ සේවයෙන් පහ කිරීමක් සම්බන්ධයෙන් කොමිෂන් සභාව විසින් කරන ලද නියමයකින් අතෘප්තියට පත් යම් පොලිස් නිලධරයකු විසින් ඊට විරුද්ධව අභියාචනයක්, 59 වන ව්‍යවස්ථාව යටතේ පිහිටුවන ලද පරිපාලන අභියාචන විනිශ්චයාධිකාරය වෙත ඉදිරිපත් කරනු ලැබිය හැක්කේ ය. කොමිෂන් සභාව විසින් කරන ලද යම් නියමයක් හෝ තීරණයක් වෙනස් කිරීමේ, මද වශයෙන් වෙනස් කිරීමේ හෝ ප්‍රත්‍යාදිෂ්ට කිරීමේ බලය ඒ විනිශ්චයාධිකාරයට ඇත්තේ ය.

දැනට බලපවත්නා රීති සහ නියෝග ඉතිරි කිරීම.

155ඎ. කොමිෂන් සභාව විසින් අන්‍යාකාරයකින් විධිවිධාන සලස්වනු ලබන තෙක්, පොලිස් බලකායට අදාළව දැනට බලපවත්නා සියලු රීති, නියෝග සහ කාර්ය පරිපාටි ක්‍රියාත්මකව සහ බලාත්මකව පැවතිය යුත්තේ ය.

කොමිෂන් සභාව පාර්ලිමේන්තුවට වගකිව යුතු බව.

155ක. බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම සහ ඉටු කිරීම සම්බන්ධයෙන් පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග මගින් සලස්වා ඇති විධිවිධාන

ප්‍රකාර කොමිෂන් සභාව පාර්ලිමේන්තුවට වගකිව යුතු සහ උත්තර දිය යුතු වන අතර එක් එක් ලිත් වර්ෂයේ කොමිෂන් සභාවේ කටයුතු සම්බන්ධයෙන් වාර්තාවක් ඒ ඒ වර්ෂයේ දී කොමිෂන් සභාව විසින් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරනු ලැබිය යුත්තේ ය.".

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 156 වන ව්‍යවස්ථාව සංශෝධනය කිරීම.

**21.** ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 156 වන ව්‍යවස්ථාව පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :-

(1) ඒ ව්‍යවස්ථාවේ (2) වන ඡේදයේ දැක්වෙන "ජනාධිපතිවරයා විසින් පත් කරනු ලබන්නේ ය. "යන වචන වෙනුවට, "41ඇ වන ව්‍යවස්ථාවේ විධිවිධානවලට යටත්ව, ජනාධිපතිවරයා විසින් පත් කරනු ලැබිය යුත්තේ ය." යන වචන ආදේශ කිරීමෙන් ; සහ

(2) ඒ ව්‍යවස්ථාවේ (5) වන ඡේදයේ දැක්වෙන "ජනාධිපතිවරයා විසින් පත් කළ යුත්තේ ය. "යන වචන වෙනුවට, "41ඇ වන ව්‍යවස්ථාවට යටත්ව, ජනාධිපතිවරයා විසින් පත් කරනු ලැබිය යුත්තේ ය." යන වචන ආදේශ කිරීමෙන්.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 170 වන ව්‍යවස්ථාව සංශෝධනය කිරීම.

**22.** ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 170 වන ව්‍යවස්ථාව පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :-

(1) "අධිකරණ නිලධරයා" යන යෙදුමේ අර්ථ කථනයේ දැක්වෙන "114 වන ව්‍යවස්ථාවේ දී හැර" යන වචන වෙනුවට, "111ඕ ව්‍යවස්ථාවේ හැර" යන වචන ආදේශ කිරීමෙන් ; සහ

(2) "රජයේ නිලධරයා" යන යෙදුමේ අර්ථ කථනයෙහි (ඇ) ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් ඡේද ඇතුළත් කිරීමෙන් :-

"(ඇඇ) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ සාමාජිකයෙක් ;

(ඇආ) මැතිවරණ කොමිෂන් සභාවේ සාමාජිකයෙක් ;

(ඈඈ) ජාතික පොලිස් කොමිෂන් සභාවේ සාමාජිකයෙක් ;

(ඈඇ) මැතිවරණ කොමසාරිස් ජනරාල්වරයා ;

(ඈඉ) මැතිවරණ කොමිෂන් සභාව විසින් මැතිවරණ කොමිෂන් සභාවට පත් කරන ලද නිලධරයන්.".

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ නවවන උපලේඛනය සංශෝධනය කිරීම.

**23.** ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ නවවන උපලේඛනයේ 1 වන ලැයිස්තුවේ 1 වන පරිශිෂ්ටය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :-

(1) ඒ පරිශිෂ්ටයේ 3 වන විෂයාංකය වෙනුවට පහත දැක්වෙන විෂයාංකය ආදේශ කිරීමෙන් :-

"3. ජාතික පොලිස් අංශයට බඳවා ගැනීම් සහ පළාත් අංශවල පොලිස් නිලධරයන් ජාතික අංශයට උසස් කිරීම, ජාතික පොලිස් කොමිෂන් සභාව විසින් කළ යුත්තේ ය.";

(2) ඒ පරිශිෂ්ටයේ 6 වන විෂයාංකයෙහි දැක්වෙන "ජනාධිපතිවරයා වෙත යොමු කරනු ලැබිය යුතු අතර," යන වචන වෙනුවට "ජාතික පොලිස් කොමිෂන් සභාව වෙත යොමු කරනු ලැබිය යුතු අතර" යන වචන ආදේශ කිරීමෙන් ;

(3) ඒ පරිශිෂ්ටයේ 7 වන විෂයාංකයෙහි දැක්වෙන "ජනාධිපතිවරයාගේ අනුමතය ඇතිව" යන වචන වෙනුවට "ජාතික පොලිස් කොමිෂන් සභාවේ අනුමතය ඇතිව" යන වචන ආදේශ කිරීමෙන් ; සහ

(4) ඒ පරිශිෂ්ටයේ 9:2 වන විෂයාංකයෙහි දැක්වෙන "අවශ්‍ය යයි ජනාධිපතිවරයා සලකන අවස්ථාවක, යම් පළාත් බඳ අංශයක සාමාජිකයන් සඳහා වෛකල්පිත පුහුණුවක් සැපයීම පිණිස ජනාධිපතිවරයා විසින් විධිවිධාන යොදනු ලැබිය හැක්කේ ය." යන වචන වෙනුවට "අවශ්‍ය යයි ජාතික පොලිස් කොමිෂන් සභාව සලකනු ලබන අවස්ථාවක, යම් පළාත් බද අංශයක සාමාජිකයන්

සඳහා වෛකල්පික පුහුණුවක් සැපයීම පිණිස ජාතික පොලිස් කොමිෂන් සභාව විසින් විධිවිධාන සලස්වනු ලැබිය හැක්කේ ය." යන වචන ආදේශ කිරීමෙන්.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් ඉවත් කරන ලද 56 වන හා 112 වන ව්‍යවස්ථා යටතේ පිහිටුවා තිබුණු කොමිෂන් සභා පවත්වා ගෙන යා යුතු බව.

**24.** (1) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 56 වන ව්‍යවස්ථාව සහ 112 වන ව්‍යවස්ථාව යටතේ පිළිවෙලින් පිහිටුවා තිබුණු රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සහ අධිකරණ සේවා කොමිෂන් සභාවේ සාමාජිකයන් වශයෙන් මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භවන දිනයට පෙරාතුව ම වූ දිනයෙහි ධුර දැරූ තැනැත්තන් සාමාජිකයන් වශයෙන් ධුර දැරිය යුතු අතර, එම ව්‍යවස්ථා ඉවත් කිරීම නොතකා, මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භවන දිනයට පෙරාතුවම වූ දිනයෙහි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ ඒ කොමිෂන් සභා වෙත පවරා දී තිබුණු බලතල පිළිවෙලින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 54 වන ව්‍යවස්ථාව සහ 111ඇ ව්‍යවස්ථාව යටතේ රාජ්‍ය සේවා කොමිෂන් සභාවට සහ අධිකරණ සේවා කොමිෂන් සභාවට සාමාජිකයන් පත් කරනු ලබන දිනය තෙක් තවදුරටත් ක්‍රියාත්මක කළ යුත්තේ ය.

(2) පිළිවෙලින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 56 වන ව්‍යවස්ථාවේ (7) වන ඡේදය යටතේ සහ 113 වන ව්‍යවස්ථාව යටතේ පත් කරනු ලැබූ රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්වරයා ලෙස ධුරය දැරූ තැනැත්තා සහ අධිකරණ සේවා කොමිෂන් සභාවේ ලේකම්වරයා ලෙස ධුරය දැරූ තැනැත්තා මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයට පෙරාතුව ම වූ දිනයේ දී, එතෙක් අදාළ වූ නියමයන් හා කොන්දේසි මත තවදුරටත් එම ධුර දැරිය යුත්තාහ.

අග්‍ර විනිශ්චයකාරවරයා, ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිශ්චයකාරවරයන්, අභියාචනාධිකරණයේ සභාපතිවරයා යනාදීන් තවදුරටත් ධුර දරන බව.

**25.** (අ) මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයට පෙරාතුව ම වූ දිනයේ දී ධුර දරන අග්‍ර විනිශ්චයකාරවරයා ද ශ්‍රේෂ්ඨාධිකරණයේ සියලු විනිශ්චයකාරවරයන් ද අභියාචනාධිකරණයේ සභාපතිවරයා සහ සියලු විනිශ්චයකාරවරයන් ද 41ඇ ව්‍යවස්ථාවේ (3) වන ඡේදයේ විධිවිධානවලට යටත්ව, මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භවන දිනයේ සිට බලපවත්වන පරිදි තවදුරටත් එම ධුර දරන්නාහ.

(ආ) මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භවන දිනයට පෙරාතුව ම වූ දිනයේ දී නීතිපතිවරයා ලෙස, විගණකාධිපතිවරයා ලෙස, පොලිස්පතිවරයා ලෙස, පරිපාලන කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු කොමසාරිස්වරයා (ඔම්බුඩ්ස්මන්) ලෙස සහ පාර්ලිමේන්තුවේ

මහ ලේකම්වරයා ලෙස ධුරය දරන සෑම තැනැත්තෙක් ම මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භවන දිනයේ සිට බලපවත්වන පරිදි, එම නියමයන් හා කොන්දේසි යටතේ ම 41ඇ ව්‍යවස්ථාවේ (3) වන ඡේදයේ විධිවිධානවලට යටත්ව තවදුරටත් එකී ධුරයන් දරන්නේ ය.

**26.** මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භවන දිනයට පෙරාතුව ම වූ දිනයේ දී– *මහාධිකරණ විනිශ්චයකාරවරයන් යනාදීන් තව දුරටත් ධුර දරන බව.*

(අ) මහාධිකරණ විනිශ්චයකාරවරයකු ලෙස ;

(ආ) අධිකරණ නිලධරයකු, උපලේඛනගත රජයේ නිලධරයකු, රජයේ නිලධරයකු හෝ පොලිස් නිලධරයකු ලෙස,

ධුරය දැරූ සෑම තැනැත්තෙක්ම, මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයේ සිට බලාත්මක වන පරිදි එම නියමයන් හා කොන්දේසි යටතේ ම තවදුරටත් එකී ධුරයන් දරන්නේ ය.

**27.** (1) පද සම්බන්ධය අනුව අන්‍යාර්ථයක් අවශ්‍ය වන්නේ නම් මිස, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ හෝ යම් ලිඛිත නීතියක හෝ යම් කොන්ත්‍රාත්තුවක, ගිවිසුමක හෝ වෙනත් ලේඛනයක "මැතිවරණ කොමසාරිස්වරයා" සහ "මැතිවරණ කොමසාරිස්වරයාගේ දෙපාර්තමේන්තුව" යන යෙදුම් එන සෑම තැනක ම ඒ වෙනුවට "මැතිවරණ කොමිෂන් සභාව" යන යෙදුම ආදේශ කරනු ලැබිය යුත්තේ ය. *ආදේශ කිරීම් සහ ඉතිරි කිරීම.*

(2) 104 වන ව්‍යවස්ථාවට අනුකූලව මැතිවරණ කොමිෂන් සභාව සංස්ථාපනය කරන තෙක් මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භවන දිනයට පෙරාතුව ම වූ දිනයේ දී මැතිවරණ කොමසාරිස්වරයා ලෙස ධුරය දරන තැනැත්තා විසින් මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භවන දිනයට පෙරාතුව ම වූ දිනයේ දී ඔහු වෙත පැවරී තිබුණු මැතිවරණ කොමසාරිස් ධුරයේ බලතල හා කර්තව්‍ය තවදුරටත් ක්‍රියාවේ යෙදීම හා ඉටු කිරීම සහ මැතිවරණ කොමිෂන් සභාවේ බලතල හා කර්තව්‍ය ක්‍රියාවේ යෙදීම හා ඉටු කිරීම කරනු ලැබිය යුත්තේ ය. මැතිවරණ කොමිෂන් සභාව එසේ සංස්ථාපනය කරනු ලබන දින සිට හා ඉන්පසුව ඔහු විසින් මැතිවරණ කොමසාරිස්වරයා ලෙස ධුරය දැරීම නතර වන්නේ ය.

(3) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 103 වන ව්‍යවස්ථාව මේ පනත මගින් සංශෝධනය කිරීමට පූර්වයෙන්, ඒ ව්‍යවස්ථාව යටතේ පත් කරන ලද මැතිවරණ කොමසාරිස්වරයා විසින් හෝ මැතිවරණ කොමසාරිස්වරයාට විරුද්ධව පවරන ලදුව මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භවන දිනයට පෙරාතුව ම වූ දිනයේ දී නිම නොවී පවත්නා සියලු සිවිල් නඩු, නඩුකර සහ වෙනත් නඩු කටයුතු මැතිවරණ කොමිෂන් සභාව විසින් හෝ මැතිවරණ කොමිෂන් සභාවට විරුද්ධව පවරන ලද සිවිල් නඩු, නඩුකර හා නඩු කටයුතු ලෙස සැලකිය යුතු අතර, මැතිවරණ කොමිෂන් සභාවේ නාමයෙන් පවත්වාගෙන ගොස් නිම කරනු ලැබිය යුත්තේ ය.

(4) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 103 වන ව්‍යවස්ථාව මේ පනත මගින් සංශෝධනය කිරීමට පූර්වයෙන්, ඒ ව්‍යවස්ථාව යටතේ පත් කරන ලද මැතිවරණ කොමසාරිස්වරයා විසින් යම් ලිඛිත නීතියක් යටතේ කරන ලද කවර හෝ තීරණයක් හෝ රීති නියමයක් හෝ නිශ්චය කිරීමක් මැතිවරණ කොමිෂන් සභාව විසින් කරන ලද තීරණයක් හෝ රීති නියමයක් ලෙස හෝ නිශ්චය කිරීමක් ලෙස සැලකිය යුත්තේ ය.

රාජ්‍ය සේවා කොමිෂන් සභාව ඉදිරියේ ඇති කාරණ ජාතික පොලිස් කොමිෂන් සභාව වෙත පැවරෙන බව.

**28.** යම් පොලිස් නිලධරයකු පත් කිරීම, උසස් කිරීම, ස්ථාන මාරු කිරීම හෝ යම් පොලිස් නිලධරයකුගේ විනය පාලනය පිළිබඳව මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භවන දිනයේ දී හෝ ඊට පෙර රාජ්‍ය සේවා කොමිෂන් සභාව ඉදිරියේ නිම නොවී පවත්නා සියලු කාරණ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ XVIIIඅ පරිච්ඡේදයෙන් පිහිටුවන ලද ජාතික පොලිස් කොමිෂන් සභාව වෙත පැවරෙන අතර ඒ අනුව ජාතික පොලිස් කොමිෂන් සභාව ඉදිරියේ ඒ කාරණ පිළිබඳව කටයුතු පවත්වා ගෙන ගොස් නිම කරනු ලැබිය යුත්තේ ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

**29.** මේ පනතේ සිංහල හා දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත් එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුත්තේ ය.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිල (දේශීය) රු. 870 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 32, ට්‍රාන්ස්වර්ක්ස් මන්දිරය, ලෝටස් පාර, කොළඹ 01, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.